# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,992 — 1964 මාර්තු 20 වැනි සිකුරාද — 1964.3.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 335 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 347 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 349 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 372 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 374 | විවිධ දැන්වීම ... ... ... | 374 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

## විශේෂ නිවේදනයයි

1964 මාර්තු 27 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 මාර්තු 26 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 මාර්තු 21 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 මාර්තු 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## රාජකීය ලංකා නාවික හමුදව

### වෛද්‍ය නිළධාරියෙකු සඳහා පුරප්පාඩුවක්

රාජකීය ලංකා නාවික හමුදවේ වෛද්‍ය නිළධාරියෙකුගේ පුරප්පාඩුවක් සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගන්නා ලද අපේක්ෂකයාට වෛද්‍ය ලුතිනන් කෙනෙකු වශයෙන් රාජකීය ලංකා නාවික හමුදවේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

**වැටුප් සහ දීමනා:—**

3. (අ) තෝරාගන්නා ලද නිළධාරියා පත්කර ගන්නා විට ඔහුගේ පළපුරුදුකම් අනුව මෙහි පහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පාදයක් මත තබනු ඇත:—

මූලික ශ්‍රෙණිය—අවුරුද්දට රු. 5,880 (360 × 1යි) රු. 6,240.

II වෙනි ශ්‍රෙණිය—අවුරුද්දට රු. 6,960—(360 × 4ක්) සහ (480 × 6)—රු. 11,280 දක්වා.

I වෙනි ශ්‍රෙණිය—අවුරුද්දට රු. 11,760—(480 × 3යි)—රු. 13,200

(ආ) පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ:—

(I) රජයේ නිවාසයක පදිංචි නොමැතිනම් රජයේ ගණන් මිමි අනුව ගෙවල්කුලී දිමනා ගෙවනු ලැබේ.

(II) රජයේ වියදමින් කෑම්පීම් සපයනු නොලැබේ නම් ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර රජයේ ගණන් මිමි අනුව ගෙවනු ලැබේ.

(III) **සේවා දීමනා.**—මසකට ලුතිනන්වරයෙකුට සහ ලුතිනන් කොමාන්ඩර් වරයෙකුට රු. 180ක සහ කොමාන්ඩර් වරයෙකුට රුපියල් 225ක සේවා දීමනාවක් ගෙවනු ලැබේ.

(IV) රජයේ වෛද්‍ය නිළධාරීන්ට අදල වන අයුරින්ම විශ්‍රාම වැටුප් රහිත දීමනා සමාන සුදුසුකම් ඇති අයට ගෙවනු ලැබේ.

(V) නාවික හමුද වැටුප් සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා ඇති අයුරින් විශේෂ ඥතා වැටුප් ගෙවනු ලැබේ.

(VI) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනාව ගෙවනු ලැබේ. පළමුවෙන් සර්මකලාපීය නිල ඇඳුම් සඳහා රු. 650කි. මීට අතිරේක වශයෙන්, අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළපසු නිල ඇඳුම් දීමනාව වශයෙන් මසකට රුපියල් 25ක මුදලක් ගෙවනු ලැබේ.

4. තෝරාගන්නා ලද අපේක්ෂකයා විවාහකයෙක් නම්, විවාහක නිවාසයකට (ලබාදිය හැකිනම්) සහ බැට්මන් සේවය සඳහා මසකට රු. 75ක දීමනාවකට ද හිමිකරුවෙක් වේ. අවිවාහකනම්; බැට්මන් සේවයද සහිතව නිළධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබීමට සුදුස්සෙක් වේ.

5. තෝරාගන්නා ලද අපේක්ෂකයාට කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් හිමි වේ. සේවා කොන්දේසි, උසස් වීම් ආදිය ගැන වැඩිදුර විස්තර කොළඹ නාවික හමුද මූලස්ථානයට පැමිණ බලාගත හැක.

6. අයැදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු යි:—

(අ) **ජාතිය :**—අයැදුම්කරුවන් ලාංකිකයන් විය යුතු යි.

(ආ) **වයස :**—අයැදුම්කරුවන් 1964 අප්‍රේල් මස 4 වන දිනට වයස අවුරුදු 32ට වැඩි නොවිය යුතු යි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**—අයැදුම්කරුවන් ඖෂධ සහ ශෛල්‍ය වෛද්‍ය පිළිබඳ උපාධිධරයෙකු හෝ උසස් සුදුසුකම් ඇත්තෙකු වියයුතු අතර වෛද්‍ය වරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූවෙකු විය යුතු යි.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය :**—අයැදුම්කරුවන් නාවික හමුදවේ නියමකර ඇති පරිදි සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතු යි. පත්වීම ලැබීමට මත්තෙන් නාවික හමුදව විසින් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

7. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව අයැදුම්පත් අත් අකුරින් ලියා 1964 අප්‍රේල් මස 4 වන දිනට පෙර නාවික හමුදධිපති, තැ. පෙ. 593, නාවික හමුද මූලස්ථානය, කොළඹ, කියා එවිය යුතු යි. අයැදුම්පත බහා එවන කවරයේ '' වෛද්‍ය නිළධාරි තනතුරක් සඳහා අයදුම්පත '' යනුවෙන් සඳහන් කළ යුතු යි. අයැදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ.

8. රජයේ සේවයේ නියුක්තව සිටින නිළධාරීන් විසින් එවන අයැදුම්පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු යි. තෝරාගනු ලැබුවහොත් එම නිළධාරියා නිදහස් කළහැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතු යි.

9. අයැදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතු යි:—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තීය සහතිකය,

(ඇ) අයැදුම්කරු පෞද්ගලිකව හඳුනන වගකියයුතු පුද්ගලයින් ගෙන් ලබාගත්, යටත්පිරිසෙයින් චරිත සහතික දෙකක්.

10. ලැබෙන අයැදුම්පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, මූලික තේරීම් මණ්ඩලයක් මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජන කිරීමෙන් පසු ය.

11. සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබූ අයැදුම්කරුවන්ට, සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනවා ඇත. මේ සඳහා අයැදුම්කරුවන්ට දැරීමට සිදුවෙන ගමන් වියදම් හෝ වෙනත් අන්දමේ වියදම් සඳහා ලංකාණ්ඩුවෙන් මුදල් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගනු නොලබන අයැදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

12. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විවිධවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතු ය.

ආර්. කදිර්ගාමර්,
කොමදෝරු,
නාවික හමුදධිපති.

මූලස්ථානය, රා. ලං. නා. හ.
තැ. පෙ. 593, කොළඹ 1,
1964 මාර්තු මස 16 දින.

## රාජකීය ලංකා නාවික හමුදව

### වෛද්‍ය නිළධාරියෙකු සඳහා අයැදුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) : ————.

2. ජාතිය (ලංකාවේ පුරවැසියෙකුනම්, උත්පත්තියෙන් ද නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කරනු ලැබුවෙකුනම් ලියාපදිංචි කළ අංකය සහ දිනය සඳහන් කරන්න) : ————.

3. ලිපිනය : රාජකාරි : ————.
පෞද්ගලික : ————.

4. උපන් දිනය : ————.

5. පහත සඳහන් පරිදි මව්පියන්ගේ විස්තර : ————.

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

6. විවාහකද යන වග : ————.

7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ඔබ ලබා ඇති ක්‍රීඩා පිළිබඳ දක්ෂකම් : ————.

8. පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ලබාගත් විශේෂ දක්ෂකම් : ————.

9. මීට පෙර නිත්‍ය සන්නද්ධ සේවයක, ස්වෙච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ සංවිධානයක සේවය කර තිබේ ද : ————.

10. මෙම තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ————.

11. මීට පෙර සන්නද්ධ සේවාවක ඇබැර්තුවක් සඳහා ඉල්ලුම් කර තිබේ ද? එසේ නම් එහි ප්‍රතිඵල : ————.

12. ඔබේ පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ හෝ ජීවිතය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න : ————.

| පාසැලේ සහ විශ්ව විද්‍යාලයේ නම | දිනය | | සමර්ථවූ පරීක්ෂණය |
|---|---|---|---|
| | ඇතුළත්වීම | පිටවීම | |
| | | | |

13. විශ්ව විද්‍යාලය හැරයෑමෙන් පසුව නියුක්තව සිටි රැකියාවල් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න:—

| ස්වාමියාගේ නම | රැකියාවෙහි ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

14. චරිත සහතික ලබාගත් අයගේ නම සහ ලිපිනය : ————.

————.
අයැදුම්කරුගේ අත්සන.

දිනය : ————.

3–761/2—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ආධුනික සහකාර ටැලිෆෝන් පරිපාලිකා තනතුරක්—දෙමළ

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සහකාර ටැලිෆෝන් පරිපාලිකා තනතුරක් සඳහා (දෙමළ) අවිවාහක කාන්තාවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ෆෝරමයේ ප්‍රකාර, ඉල්ලුම්පත්‍ර අයදුම්කාරියන්ගේ අත් අකුරින්ම ලියා 1964 අප්‍රේල් මස 15 දිනට මත්තෙන් කොළඹ, ප්‍රධාන තැපැල් කාර්යාලයේ, පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

**2. වැටුප් ක්‍රමය සහ සේවා කොන්දේසි :—**

(i) (ඒ) මෙරට පුහුණුව ලබන කාලය තුළ : මසකට රු. 150.00.

(බී) පුහුණුව නිම කිරීමෙන් පසු : වර්ෂයකට රු. 2,700—10×120 සහ 7×180—රු. 5,160.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කාරියට මාස හයේ සිට සහ හත දක්වා වන කාලයක් තුළ දෙපාර්තමේන්තුවේ, අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට සහ අවශ්‍ය වුවහොත්, පසුව එක්සත් රාජධානියේ වැඩිදුරටත් අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමටත් නියම කරනු ලැබේ. පුහුණුවීමේ කාලය දීර්ඝකිරීම හෝ කෙටිකිරීම පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අභිමතය පරිදි සිදුවනු ඇත. පුහුණුවීමේ කාලය තුළ දීමනා ආදිය ගෙවනු ලබන්නේ තත්කාලීන ආණ්ඩුවේ රෙගුලාසි අනුවය.

(iii) පුහුණුව සාර්ථක ලෙස නිමකළ පසු ඇය අවුරුදු තුනක පරීක්ෂා කාලයක් පිට සහකාර ටැලිෆෝන් පරිපාලිකාවක් වශයෙන් පත් කරනු ලැබේ.

(iv) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලැබූ නිලධාරිනියට අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට පෙර ඕනෑම අවස්ථාවක රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායිකාවක වශයෙන් තවදුරටත් සිටීමට හෝ ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු වීමට හෝ සිය කැමැත්ත ප්‍රකාශ කළ හැකිය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීම පසුව වෙනස් කළ නොහැක.

(v) ආධුනික සහකාර ටැලිෆෝන් පරිපාලිකාවක් සිය චරිතය, රාජකාරිය කෙරෙහි දක්වන උනන්දුව සහ සහකාර ටැලිෆෝන් පරිපාලිකාවක වශයෙන් පසුව පත් කරනු ලැබීම සඳහා වූ කොන්දේසි සම්පූර්ණ කිරීමට ඇති හැකියාව යන මේ කරුණු සම්බන්ධයෙන් පෝස්ට්මාස්ටර් ජනරාල් සෑහීමකට පත් වන අයුරු කටයුතු නොකළහොත් ඕනෑම අවස්ථාවක දී ඇගේ සේවය නතර කිරීමට ඉඩ ඇත.

**3. අවශ්‍ය සුදුසුකම් :—**

(i) 1964 මාර්තු මස 20 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 40 නොවැඩි විය යුතු ය.

(ii) යහපත් චරිතයකින් සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) විෂයයක් වශයෙන් දෙමළ භාෂාව සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරිනියක් විය යුතු ය. (ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

4. ඉහත සඳහන් 3 වැනි ඡේදය යටතේ සුදුසුකම් ඇති රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනියන් ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගින් එවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරිනීන්ගේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන විට තමන්ට ඔවුන් (තෝරා ගනු ලැබුවහොත්) මුදා හැරීමට හැකි නොහැකි බව දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් කාර්යාල කාර්ය සංවිධාන සංග්‍රහයේ අංක 109 දරණ පාලන රෙගුලාසියට අනුව සඳහන් කළ යුතුය.

5. අයදුම්කාරියන් විසින් තම ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපතක් (මුල් පිටපත් නොවේ) එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතික පත්‍රය (බව්තීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පිළිබඳ කරුණු උදෙසා නිකුත් කරනලද සහතික පත්‍ර භාරගනු නො ලැබේ.)

(බී) ලබාගෙන ඇති උසස් ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය.

(සී) අයදුම්කාරියගේ චරිතය සහ ඇය තනතුරට පත් කිරීම සඳහා ඇති යෝග්‍යතාවය පිළිබඳ මෑත දී ලබාගත් සහතික පත්‍ර තුනක්.

සැ. යු.—මෙම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. තෝරාගනු ලැබූ අයදුම්කාරිය, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සහ පිටරට අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට තමා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි ඡේදයේ (II) වැනි කොටසේ මුලින් පළකර ඇති, රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි ද සැලකිල්ල යොමුකරවනු ලැබේ.

අයදුම්කාරිය, පිටරට අභ්‍යාස පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුව හොත් ඇයට—

(ඒ) වෙනත් කරුණු ද අතර, අභ්‍යාස පාඨමාලාවේ වැඩ කටයුතු විශ්වාසදායක ලෙසත්, උද්‍යෝගී ලෙසත් කරගෙන යාමට සහ එය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමටත් එසේ සතුටුදායක ලෙස සම්පූර්ණ කළ පසු, අවශ්‍ය වුවහොත් නියමිත කාල පරිච්ඡේදයක් (ආණ්ඩුව මගින් තීරණය කරනු ලබන) ලංකාණ්ඩුවට සේවය කිරීමටත් පොරොන්දුවෙමින් ලංකාණ්ඩුව සමග ගිවිසුමකට ද—

(බී) ගිවිසුමේ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකිවූ කල්හි අභ්‍යාස පාඨමාලාව සම්බන්ධයෙන් ලංකාණ්ඩුව සහ/හෝ ප්‍රදානය කිරීමේ වෙනත් ඒජන්සියක් විසින් දරණු ලැබූ සියලුම වියදම් (එනම් වැටුප, දීමනා යාත්‍රා ගාස්තු, ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ගෙවීමට පොරොන්දු වෙමින් අභ්‍යාස පාඨමාලාවේ සම්පූර්ණ ගාස්තුවට ම බැඳුම්කරයකට ද ඇතුළත් වීමට සිදුවෙයි.

8. ඉල්ලුම්පත්‍ර සහ ඊට අදාළ වෙනත් ලියකියවිලි පෝස්ට්මාස්ටර් ජනරාල් වෙත එවිය යුතුය. එසේ නැතිව ඒවා දෙපාර්තමේන්තුවේ කිසි ම නිලධාරියකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඒ. ඇස්. කොහොඹන් වික්‍රම,
වැඩ බලන පෝස්ට්මාස්ටර් ජනරාල්.

පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය,
ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ 1.

### ඉල්ලුම් පත්‍ර ෆෝරමය

............................................. වන මම තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ආධුනික සහකාර ටැලිෆෝන් පරිපාලිකා (දෙමළ) තනතුරක් මෙයින් ඉල්ලා සිටිමි.

මගේ උප්පැන්න සහතිකය ද,

.............................................

.............................................

.............................................

.............................................

(ඥාතීන් නොවන, ඔබේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා පාඨශාලාවකට හෝ විද්‍යාලයකට සම්බන්ධ කමක් නොමැති වගකිවයුතු පුද්ගලයින් තිදෙනෙකුගේ නම්, ලිපින සහ වෘත්තීන් මෙහි සඳහන් කරන්න.)

..........................................................................

..........................................................................

ගෙන් ලබාගත් චරිත සහතික පත්‍ර වලද මා සමත්වූ උසස් ම විභාගවල සහතික පත්‍රවල ද පිටපත් මීට යා කර ඇත.

මා විවාහ වී නැත.

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. අයදුම්කාරියගේ උපන් දිනය සහ උපන් ස්ථානය :————.

4. (ඒ) පියා උපන් ස්ථානය :————.

(බී) මව් උපන් ස්ථානය :————.

5. පියාගේ නම :————.

ලිපිනය :————.

වෘත්තීය හෝ රක්ෂාව :————.

6. ඔබ ලාංකිකයෙක් ද යන වග සඳහන් කරන්න :—

7. ඔබ ලබාගෙන ඇති විශ්ව විද්‍යාල උපාධිය කුමක්දැයි සඳහන් කරන්න :————.

8. ඔබ සමත් වෙනත් විභාගවල විස්තර සපයන්න :————.

9. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වීමෙන් පසු ඔබ රක්ෂාවක යෙදී සිටියේද ? එසේ නම් ඒවා පිළිබඳ විස්තර හා දින සපයන්න :————.

10. ඔබ මුදල් කරදරවලින් තොරව සිටින්නෙහිද ? :————.

මගේ විශ්වාසයේ හා දැනුමේ හැටියට ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

3–799—64.3.20 දින අංක 13.992 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ප්‍රචාරක නිලධාරි තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක නිලධාරි තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුවම පිළියෙල කර ගත යුතු අයදුම්පත් 1964.4.10 වැනි දින හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. අංක 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—120× 17 සහ 180× 4—රු. 4,620ක් වන අතර වර්‍ෂයකට රු. 2,820ක් ලැබීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමෙන් ද ඇත්තේ ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

(i) මෙය විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරෙකි.

(ii) කෙටි කාලයක දැනුම් දීමකින් පත් වීම භාර ගැනීමට තෝරා ගනු ලබන අයදුම්කරු සූදානමින් සිටිය යුතුය.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු මුලින්ම පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් කොටය, දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අය වැඩ බැලීමේ කාලයකට යටත් කොට පත් කරනු ලැබේ.

(iv) තෝරාගනු ලබන අයදුම්කරු රජයේ භාෂා ප්‍රතිපත්තියේ කාර්යයන් සඳහා "නව ප්‍රවේශකයෙකු" වෙතොත් රජයේ භාෂා ප්‍රතිපත්තියත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානත්, ක්‍රියාත්මක කිරීමෙහි ලා රජය විසින් මෙතෙක් පනවා තිබෙන්නාවූ ද, මින් ඉදිරියට පනවනු ලබන්නාවූද, නොයෙක් නීති නියෝගාදියට ඔහු අවනත විය යුතුය.

(v) එබඳු නිලධාරියෙකු තම ආධුනික/වැඩ බැලීමේ කාලය තුළ දී සිංහල භාෂා විෂයයෙහි ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

(vi) ආධුනික/වැඩ බැලීමේ කාලය අවසානයේ දී ඔහුගේ පත්වීම ස්ථිර කරවා ගැනීම පිණිස ඔහු වෙත තිබිය යුතු වෙනත් සුදුසුකම් අතර, සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත් ව තිබීම ද එකක් වේ. ආධුනික/වැඩ බැලීමේ කාලය තුළ දී නියමිත ප්‍රමාණයේ සිංහල ප්‍රවීණතාවයක් ලබා ගැනීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ සේවය අත් සිටුවීමට/දරමින් සිටි ස්ථිර තනතුරට ආපසු හරවා යැවීමට ඉඩ තිබේ. එහෙත් ඔහුගේ වැඩ කටයුතු සහ හැසිරීම සතුටුදායකව තිබී, රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා ඔහු අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැයි පත් කිරීමේ බලධාරියා සට ඒත්තු ගියොත්, එසේ සේවය අත්හිටුවීම/ආපසු හරවා යැවීම ප්‍රමාද කළ හැක. නියමිත දිනට පසුව සෑහෙන කාල සීමාවක් තුළ දී නිලධාරියා එම පරීක්‍ෂණයෙන් සමත් වූවොත් කලින් සමත් නොවීම නිසා ඔහුට නොලැබී ගිය ජ්‍යෙෂ්ඨතාවය නැවත ලබාදීම පත් කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි සිදු වේ.

**සටහන.**—සුදුසුකම් ලැබීමේ විභාගය මුළුමනින්ම සිංහල මාධ්‍යයෙන් රැගෙන සමත්වූ අය සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—තමන් වෙත පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන තරම් සාක්‍ෂි සෑම අයදුම්කරුවෙකු විසින් ම ඉදිරිපත් කළ යුතුය :—

(i) 64.4.10 වැනි දින වන විට තමාගේ වයස අවුරුදු 20කට නොඅඩුව සහ අවුරුදු 40කට නොවැඩිව තිබෙන බව. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ii) තමා විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

(iii) (අ) (i) පොදු අධ්‍යාපන සහතිකය (උසස් පෙළ) හෝ සම තත්ත්වයේ වෙනත් සහතිකයක්.

(ii) පත්‍ර කලාව පිළිබඳ දැනීම විශේෂ සුදුසුකමක් වනු ඇත. හෝ

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමානත්වයේ වෙනත් සහතිකයක් ද,

(ii) පුවත් පත් කලාව පිළිබඳව අවුරුදු පහක පළ පුරුද්දක් ද ලබා ඇති බව.

(ඉ) ප්‍රචාරය කිරීම පිණිස, ලිපි රචනය කිරීම, සංස්කරණය කිරීම සහ පිළියෙල කිරීම තමාට පුළුවන් බව.

5. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් ලියකියවිලි නොව) තම අයදුම් පත්වල අමුණා එවිය යුතුය :—

(i) උප්පත්තිය ලියාපදිංචි කරවීමේ සහතිකය (බව්තීස්ම කිරීමේ සහතිකය සහ උපකෘත පාඨශාලා ව්‍යවස්ථාව යටතේ එකී පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කෙරෙන සහතික මේ සම්බන්ධයෙන් භාරගනු නො ලැබේ.)

(ii) ඉහත දැක්වෙන 4 වැනි ඡෙදයේ (iii) (අ) (ii) සහ (iii) (ආ) (ii) යන උප ඡෙදවල සඳහන් පළපුරුද්ද පිළිබිඹු කෙරෙන සහතික.

**සටහන.**—මෙකී සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

6. අයදුම් පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියකියමන් හෝ එවිය යුත්තේ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ තැන අමතා මිස, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු වෙත පුද්ගලිකව අමතා නොවේ.

7. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදය ආරම්භයෙහි දක්වා තිබෙන්නාවූද, රාජ්‍ය සේවයෙහි තනතුරුවලට නිලධාරීන් පත් කිරීමේ දී බලපාන්නාවූ ද, පොදු කොන්දේසි ද කියවා බලන්න.

8. අයදුම් පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. සෑම අතින්ම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඕ. ඒ. ද සිල්වා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ වෙනුවට.

1964 මාර්තු මස 14 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500,
කොළඹ 1.

## අයදුම් පත්‍රයයි

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක නිලධාරි තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) වාසගම :————.

(ආ) අනෙකුත් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

1964.4.10 දින වන විට නිවැරදි වයස :—

අවුරුදු :——යි, මාස :——යි, දවස් :——යි.

4. රටවැසි භාවය :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. රචනය කිරීම, සංස්කරණය කිරීමාදියෙහි පළපුරුද්ද :————.

7. පුවත් පත් පළපුරුද්ද :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන්නට යෙදුන සියලු තොරතුරු සහ විස්තර සත්‍ය බවටත්, නිවැරදි බවටත්, මෙයින් සහතික කරමි. මෙහි දැක්වෙන යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ තෝරා ගැනීමට පෙර එළිදරව් වූවොත් එයින් මා නුසුදුස්සෙකු වන බවත්, එම දෝෂය පත් කිරීමෙන් පසුව එළිදරව් වූවොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් අස් කළ හැකි බවත් මම පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–773—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**1 වැනි ශ්‍රේණියේ මුල් ගුරු සහ 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණිවලට රජයේ සිංහල ගුරු භවතුන් උසස් කිරීම**

ඉහත සඳහන් ශ්‍රේණිවලට උසස් කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින පහත සඳහන් සුදුසුකම් ලත් රජයේ ගුරු භවතුන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. 1960.7.21 වැනි දින උපකෘත පාසල් වල සේවයේ සිටි ගුරු භවතුන් **මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.**

1 වැනි **ශ්‍රේණිය : වැටුප් ක්‍රම.**—පුහුණු 1 වැනි පෙළ—

වර්ෂයකට රු. 1,776—7×72 හා 9×120—රු. 3,360.

සහතික පත්‍ර ලත් 1 වැනි පෙළ—වර්ෂයකට රු. 1,728—11×72—රු. 2,520.

2. **වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණිය : වැටුප් ක්‍රම—**

පුහුණු 1 වැනි පෙළ—වර්ෂයකට රු. 1,524—8×72 හා 9×120—රු. 3,180.

සහතික පත්‍ර ලත් 1 වැනි පෙළ—වර්ෂයකට රු. 1,488—11×72—රු. 2,280.

**1 වැනි ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම්—**

රජයේ පාසල් වල 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට 1958.9.1 දින හෝ ඊට ප්‍රථම උසස් කරනු ලැබ දැනට සේවයේ සිටින, 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට අයත් ගුරුවරුන් සහ ගුරුවරියන් මේ සඳහා ඉල්ලුම් කළ යුතුය.

**සැලකිය යුතුයි.**—යම් කිසි කාල සීමාවකට 1 වැනි ශ්‍රේණියට උසස් කිරීමෙන් වළක්වනු ලැබ සිටින ගුරු භවතුන් එම කාල සීමාව අවසන් වී නැත් නම් උසස් වීම සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

**2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් :**

පිරිමි—

(1) 1951.10.31 වැනි දින හෝ ඊට ප්‍රථම රජයේ ගුරුවරුන් වශයෙන් පත්වීම් ලත් සහ

(2) 1951.10.31 වැනි දින හෝ ඊට ප්‍රථම පුහුණු 1 වැනි පෙළ හෝ නුපුහුණු 1 වැනි පෙළ ලැබූ ගුරුවරු. (ඉහත සඳහන් (1) සහ (2) යන සුදුසුකම් දෙකම තිබිය යුතුයි).

ගැහැණු—

(1) 1944.9.30 වැනි දින හෝ ඊට ප්‍රථම රජයේ ගුරුවරියන් වශයෙන් පත්වීම් ලත් සහ

(2) 1944.9.30 වැනි දින හෝ ඊට ප්‍රථම පුහුණු 1 වැනි පෙළ හෝ නුපුහුණු 1 වැනි පෙළ ලැබූ ගුරුවරියන් (ඉහත සඳහන් (1) සහ (2) යන සුදුසුකම් දෙකම තිබිය යුතුයි).

**සැලකිය යුතුයි.**—යම් කිසි කාල සීමාවකට 2 වැනි ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස් කිරීමෙන් වළක්වනු ලැබ සිටින ගුරු භවතුන් එම කාල සීමාව අවසන් වී නැත් නම් උසස් වීම සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

**ඉල්ලුම් පත්‍ර.**—ඉහත සඳහන් සුදුසුකම් ලත් ගුරු භවතුන් පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙළ කොට, **තමන් සේවය කරන ප්‍රදේශයේ/දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන නිලධාරි වෙත 1964 අප්‍රේල් මස 3 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය.** ලිපි කවරයේ වම් උඩ කෙළවරේ, "මුල් ගුරු ශ්‍රේණියට උසස් කිරීම" යන්න සඳහන් කළ යුතුය.

ඒ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 මාර්තු මස 16 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**රජයේ සිංහල ගුරු භවතුන් උසස් කිරීම**

*** මුල් ගුරු 1 වැනි ශ්‍රේණිය**

*** මුල් ගුරු 2 වැනි ශ්‍රේණිය/ජ්‍යෙෂ්ඨ උපගුරු**

(* අනවශ්‍ය කොටස් කපා හරින්න).

1. ගුරු භවතාගේ නම :————.
2. ස්ත්‍රී පුරුෂ භාවය :————.
3. ලියාපදිංචි කළ අංකය :————.
4. උපන් දිනය :————.
5. ආගම :————.
6. දිස්ත්‍රික් අක්ෂරය සමග දැන් සේවය කරන පාසලේ නම සහ එහි ලිපිනය :————.
7. වෘත්තීය සුදුසුකම්—
   (1) පුහුණු 1 වැනි පෙළ ලබාගත් දිනය :————.
   (2) නුපුහුණු 1 වැනි පෙළ ලබාගත් දිනය :————.
8. රජය යටතේ ස්ථිර ගුරු භවතකු වශයෙන් පත්වීම ලත් දිනය :————.
9. දැන් සිටින වැටුප් ක්‍රමය :————.
10. දැන් ලබන වාර්ෂික වැටුප (දීමනා හැර) : රු.————.
11. උසස් වීම සඳහා ඉල්ලුම් කරන ශ්‍රේණිය :————.
12. මුල් ගුරු 1 වැනි ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත සඳහන් විස්තර සඳහන් කරන්න :————.

    2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස් වීම ලත් දිනය :————.

    **(උසස් කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)**
13. යම් කිසි කාල සීමාවකට උසස්වීම වළක්වා තිබී දැනට එම කාල සීමාව අවසාන වීම නිසා ඉල්ලුම් කරන්නේ නම් පහත සඳහන් විස්තර සඳහන් කරන්න :—
    (අ) උසස්වීම වැළැක්වීමට හේතුව :————.
    (ආ) වළක්වා තිබුණු කාල සීමාව :———— සිට ————, දක්වා. (ලිපියේ පිටපතක් අමුණන්න).
14. පසු ගිය අවුරුදු 5 ඇතුළත යම්කිසි විනයානුකූල දඬුවමක් පමුණුවා තිබේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. (ඒ සම්බන්ධ ලිපියේ පිටපතක් ද අමුණන්න).
15. පසුගිය අවුරුදු 5 ඇතුළත සහතික පත්‍රයෙහි යම් කිසි අසතුටු දායක සටහනක් ලබා තිබේ නම් කාලසීමාව සඳහන් කරන්න :————.
16. රජයේ ගුරුවරයකු/ගුරුවරියක වශයෙන් සේවා සටහන : ————.

| පාඨශාලාවේ නම | සිට | තෙක් |
|---|---|---|
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |

17. පුරුෂයා/භාර්යාව ගුරුවරයකු/ගුරුවරියක නම්—
    (අ) රජයේ ගුරුවරයෙක් ද/ගුරුවරියක් ද :————.
    (ආ) ඔහුගේ/ඇගේ නම :————.
    (ඉ) ලියාපදිංචි කළ අංකය :————.
    (ඊ) වෘත්තීය සුදුසුකම් :————.
    (උ) දැන් දරන තනතුර හා ශ්‍රේණිය :————.
    (ඌ) දිස්ත්‍රික්ක අක්ෂරය සමග දැන් සේවය කරන පාසල සහ එහි ලිපිනය :————.

ඉහත සඳහන් කරන ලද විස්තර නිවැරදි බවත් ම විසින් ඉල්ලුම් කරන ලද ශ්‍රේණියට මීට ඉහත උසස් වීමක් ලබා නොමැති බවත් සහතික කරමි. මා උසස් කරනු ලැබීමෙන් වළක්වා නොමැති බවත් */උසස් වීම වැළැක්වීමේ කාල සීමාව අවසන් ඇති බවත් * ප්‍රකාශ කරමි. දැනට මට විරුද්ධව කිසිම විනයානුකූල විභාගයක් නොමැති බවද තවදුරටත් ප්‍රකාශ කරමි. උසස් කරනු ලැබීමේ දී කවර හෝ පාසලක ද ඊට පසු දෙපාර්තමේන්තුවේ නියෝග වලට අනුකූලවද සේවය කිරීමට මම එකඟ වෙමි.

ඉල්ලුම් කරන ගුරුවරයාගේ */ගුරුවරියගේ * අත්සන.

දිනය :————.

ම විසින් පූර්වෝක්ත විස්තරවල හරි වැරදි බැලූ බවත් ඒවා නිරවද්‍ය බවත් මම සහතික කරමි.

විද්‍යාලයාධිපති*/මුල් ගුරුවරයා*/වරිය*ගේ

අත්සන.

දිනය :————.

* අනවශ්‍ය කොටස් කපා හරින්න.

3-805—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද හමුදව

### සෙසු නිළ පත්වීම්

ලංකා යුද හමුද නිත්‍ය හට සේනාවෙහි '' කායර්සේවා ලංකා ඉංජිනේරු බලකාය '' ට සෙබලුන් ඉඳුරාම බඳවා ගැනීම පිණිස ඇබෑර්තු තිබේ.

(අ) මෙම ඇබෑර්තු පිරවීම පිණිස පහත සඳහන් සෑම පත්වීමක් ඉදිරිපසින් දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ :—

| පත්වීම | ඒකකය | අවශ්‍ය විශෙෂ සුදුසුකම් |
|---|---|---|
| (i) කෝප්‍රල්—වැඩ පිළිබඳ ෆෝර්මන් (විදුලි හා යාන්ත්‍රික) '' ඒ '' ගණය II වෙනි ශ්‍රෙණිය | කා. සේවා ලංකා ඉං. බලකාය ... | කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්ව සිටියයුතු අතර ලංක කාර්මික විද්‍යාලයෙහි (අර්ධකාල) විදුලිය හා යාන්ත්‍රික පාඨම් මාලාවේ පළමුවෙනි අවුරුද්දේ සාර්ථක ලෙස සම්පූර්ණකර සිටීම සහ රජය යටතේ හෝ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක විදුලිය හා යාන්ත්‍රික වැඩ පිළිබඳ සුලු පරිපාලකයෙකු වශයෙන් අවුරුදු 2 ක පලපුරුද්දක් තිබිය යුතුයි. හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග තත්ත්වයට අමතරව රජය යටතේ හෝ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක විදුලිය හා යාන්ත්‍රික වැඩ පරිපාලනයෙහි යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (ii) ඉංජිනේරු සෙබල—කාර්මික ලිපිකරු (කායර් සෙවා) '' බී '' ගණය III වෙනි ශ්‍රෙණිය | කා. සේවා ලංකා ඉං. බලකාය ... | කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්ව සිටිය යුතු අතර ලංකා කාර්මික විද්‍යාලයේ වූ වාණිජ සහතික පත්‍ර පිළිබඳ පාඩම් මාලාවන් සතුටුදයක ලෙස සම්පූර්ණකර සිටිය යුතුයි. හෝ ජ්‍යෙෂ්ඨය සමත්ව සිටියයුතු අතර විනාඩියකට වචන 15—20 දක්වා යතුරු ලේඛනය කල හැකිවීම හා රජයේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ සමාගමක යටත් පිරිසෙයින් අවුරුදු එකක අඛණ්ඩ ලිපිකාර සේවයක පලපුරුද්දක් තිබිය යුතුයි. |

(ආ) හුරුකම සහ කායර්ක්ෂමතාවය මැනගැනීම සඳහා තෝරාගැනීමට පෙර අයදුම්කරුවන් වෘතීය පරීක්ෂණයකට භාජන කෙරෙනු ඇත.

(ඇ) ඉහත සඳහන් I වන ඡෙදයේ (ඒ) ඇති '' විශේෂ සුදුසුකම් '' නොමැති අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

(2) ඉහත සඳහන් I වන ඡෙදයෙහි දක්වා ඇති '' විශේෂ සුදුසුකම් '' වලට අමතර වශයෙන් යුද හමුදවේ ඉඳුරාම බැඳෙන සෙබළකු ලෙස බැඳීම පිණිස අයදුම්කරුවන් පහත සඳහන් සාමාන්‍ය කොන්දේසි සපුරාලියයුතුයි :—

(අ) අයදුම්කරුවකු :—

(i) ලාංකිකයකු විය යුතුයි.
(ii) 1964 මැයි මස 1 දිනට වයස අවුරුදු 18 ට නොඅඩුව ද, 1964 ජූලි 31 දිනට වයස අවුරුදු 40 ට නොවැඩිව ද,
(iii) සිංහලෙන්, දෙමළෙන්, හෝ ඉංග්‍රීසියෙන් පස්වන පන්තිය සමත්ව ද,
(iv) යුද හමුද ආඥපතිගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම, හා
(v) උස අඩි 5 යි, අඟල් 4 ට නොඅඩුව ද සිටිය යුතුය.

කෙසේ වෙතත්, යුද හමුද ආඥපතිගේ අනුමැතිය ඇතිව විශේෂ අවස්ථාවලදී අවුරුදු 40 ට වැඩි වන හෝ උස අඩි 5 යි අඟල් 4 ට අඩුවෙන් උස ඇති හෝ අවුරුදු 40 ට වඩා වයස් වූ හා උස අඩි 5 යි අඟල් 4 ට අඩු වූ අය බඳවා ගතහැක.

(ආ) මේ තනතුර සඳහා ඉදිරිපත්වන සේවාමුක්ත භටයෙක් වේ නම් ඉහත දක්වන ලද සුදුසුකම්වලට අමතර වශයෙන් :—

(i) තමා ලංකාරක්ෂක හමුදව ඇතුලු බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුද්දකට නොඅඩු කාලයක් සේවය කර ඇති බවට හා

(ii) යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරණු ලැබීමේදී හේවා චරිතය '' ඉතාහොඳ '' යයි වර්ග කර තිබිය යුතුයි.

(3) **සේවා කාලය.**—අවුරුදු 12 සේවය සඳහා බඳවා ගනු ලබන සෙබළෙකු, පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බලහමුදවේ ද, සේවය කිරීමෙන් පසු අස්කරණු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලකුට ස්වකීය නිත්‍ය බල හමුද සේවය අවුරුදු 12 දක්වා දික් කරණු ලැබීමටත් අවුරුදු 32 දක්වා එහිම සේවය කිරීමටත් ඉඩ තිබේ.

(4) **වැටුප් හා දීමනා.**—යුද හමුද නිත්‍ය භට සේනාවේ සෙසුනිළ දරණ සෙබලුන් සඳහා වූ වැටුප් හා දීමනා 1961 අප්‍රියෙල් මස 28 දින දරණ අංක 12,395 රාජ්‍ය නිවේදිත පත්‍රයේ පළවුන 1961 යුද හමුද වැටුප් සංග්‍රහයේ 2 වන කොටස අනුකූලවනු ඇත.

(අ) **වෘත්තීය සෙබලුන්ගේ වැටුප.**—කෝප්‍රල් නිලය හෝ ඊට සමාන නිළය හෝ පහත් නිලයක් දරණ, වෘත්තීයකට බඳවා ගත්තකු වශයෙන් ගැනෙන සෙබළකුගේ වැටුප, යථෝක්ත ගණය, ගණය තුල වූ පන්තියට අනුකූලව ඔහුට නියමිත වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| | ''එක්ස්'' ගණයේ වෘත්තීන් | | | ''ඒ'' ගණයේ වෘත්තීන් | | | ''බී'' ගණයේ වෘත්තීන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පන්තිය 1 රු. | පන්තිය 2 රු. | පන්තිය 3 රු. | පන්තිය 1 රු. | පන්තිය 2 රු. | පන්තිය 3 රු. | පන්තිය 1 රු. | පන්තිය 2 රු. | පන්තිය 3 රු. |
| සාමාන්‍ය සෙබළ හෝ සමාන නිළය ... | 1,470 | 1,170 | 1,020 | 1,350 | 1,110 | 960 | 1,260 | 1,050 | 930 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිළය ... | 1,620 | 1,320 | 1,170 | 1,500 | 1,260 | 1,110 | 1,410 | 1,200 | 1,050 |
| කෝප්‍රල් හෝ සමාන නිළය ... | 1,980 | 1,680 | 1,530 | 1,860 | 1,620 | 1,470 | 1,770 | 1,560 | 1,410 |

(ආ) සැරයන් නිලය හෝ ඊට සමාන හෝ උසස් නිලයක් දරණ, වෘත්තියයකට බඳවාගත්තෙකු වශයෙන් ගැනෙන සෙබළකුගේ වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| | උසස්ම පෙළේ වෘත්තිය සෙබළුන් | | සෙසු වෘත්තිය සෙබළුන් |
|---|---|---|---|
| | ''එක්ස්'' ගණය පන්තිය 1 රු. | ''ඒ'' ගණය පන්තිය 1 රු. | ''බී'' ගණය පන්තිය 1 රු. |
| සැරයන් හෝ සමාන නිළය ... ... ... ... | 2,520 | 2,430 | 2,280 |
| මණ්ඩලික සැරයන් හෝ සමාන නිළය ... ... ... | 2,880 | 2,790 | 2,550 |
| බලලත් නිලධාරි 2 පන්තිය ... ... ... ... | 3,180 | 3,000 | 2,760 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් ... ... ... | 3,360 | 3,180 | 2,940 |
| බලලත් නිළධාරි 1 පන්තිය ... ... ... | 3,540 | 3,360 | 3,120 |

(ඇ) **ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල.**—රජයේ ගෙවීම් ක්‍රමයට ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල පහත සඳහන් වර්ගවලට අයත් සෙබළුන් හට ගෙවනු ලැබේ :—

(1) හමුද වියදමෙන් ආහාර නොසැපයෙන විවාහක සෙබළා,

(2) හමුද නිවාසවලින් බැහැරව විසීමට අවසර ලත් අවිවාහක සෙබළා, හා

(3) හමුද නේවාසිකාගාරයේ ආහාර නොගෙන නිවාඩු ලබා සිටින අවිවාහක සෙබළා.

(ඈ) හමුද වියදමෙන් ආහාර සපයනු ලබන අවිවාහක හෝ විවාහක සෙබළකුට හිමිවනුයේ —

(1) රජයේ ගෙවීම් ක්‍රමයට අනුකූලවූ ජීවනාධාර මුදලේ සහ විශෙෂ ජීවනාධාර එකතුව, හා

(2) යුද හමුද ආඥපති විසින් නිගමනය කරුණු ලබන ආහාර සැපයීම පිණිස වූ වියදම අතර වෙනසය.

(ඉ) **ගෙවල් කුලී.**—සේවා හෝ රජයේ නිවාසවල නොවෙසෙන විවාහක සෙබළුන්ට හා නේවාසිකාගාරවල ඉඩ පහසුකම් නොමැති හෝ රජයේ නිලධාරීන් සඳහා වූ දීමනා හා කොන්දේසි අනුව, ඔහුගේ පත්වීම සඳහා දෙනු ලබන විශේෂ නිවාස නොමැති අවිවාහක සෙබළාට ගෙවල් කුලී ගෙවනු ලැබේ.

(ඊ) විවාහකයන් සඳහා වූ රජයේ හෝ සේවා නිවාසවල වෙසෙන සෙබළකු ගෙවල් කුලී දීමනාවට අහිමි වනු ඇත.

(උ) **රජක දීමනා.**—(1) නේවාසිකාගාරයේ වෙසෙන සෙබළකුගේ නිළ ඇඳුම් හමුද වියදමෙන් සෝද දෙනු ලැබේ.

(2) හමුද නිවාසයෙන් බැහැරව වෙසෙන සෙබළකු, ඔහුගේ නිළ ඇඳුම් සේදීම පිණිස යුද හමුද ආඥපති විසින් නියම කරණු ලබන දීමනාවට හිමිකරුවකු වනු ඇත.

(ඌ) **සේවා වැඩිවීම්.**—සෑම සෙසුනිළ දරන්නකුටම සේවා වැඩිවීම් වශයෙන්, සෑම ගණන් ගැනෙන 5 අවුරුදු සේවා කාලයට, මසකට රු. 4.50 බැගින් ගෙවනු ලැබේ.

(එ) **නිළ වැඩිවීම.**—කෝප්‍රල් සිට බලලත් නිලධාරි 2 දක්වා නිළ වැඩිවීම් වශයෙන් එම නිළයේ සෑම 4 අවුරුදු සේවා කාලයට රු. 7.50 බැගින් ද, බළලත් නිළධාරි 1, 4 අවුරුදු සේවා කාලයට රු. 15.00 බැගින් ද ලැබෙනු ඇත. කෝප්‍රල් හෝ සමාන නිළයක් දරන්නකුට හිමිවනුයේ නිළ වැඩවීම් 4 ක් පමණය.

(5) ඉහත සඳහන් (අ) (1) ඡේදයෙහි දක්වෙන ඉඳුරාම බඳවා ගැනීම පිළිබඳ ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීති වලට අනුකූලවිය යුතුයි :—

(අ) ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනය අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන්, ඉල්ලුම් කරුගේ අත්අකුරින්ම පිළියෙල කර පුරවන ලද ඒවා විය යුතුයි. මුද්‍රනය ටයිප් හෝ ස්ටිරියෝ ටයිප් කරණ ලද ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍ර '' යුද හමුද ආධුනිකයන් බඳවන නිලධාරි, යුද හමුද මූලස්ථානය, තැ. පෙ. අංක 553, කොළඹ''. යන ලිපිනයට එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතු පිටද, '' ඉල්ලුම් පත්‍රය, නිත්‍ය බලසේනා සෙසුනිල පත්වීම් '' යන්න සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර 1964 අප්‍රියෙල් මස 3 සිකුරාද පස්වරු 4.30 පෙර යුද හමුද මූලස්ථානයට ලැබිය යුතුයි.

(ඇ) ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින තනතුර හා ඒකකය සඳහන් කලයුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍ර වල පිටපත් පමණක් අමුණා එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කර නැති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශෙෂ සහතිකය. බෞතිස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත්කරණ ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාර ගනු නොලැබේ.

(2) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(3) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතදී ලබාගත් සහතික තුනක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුයි.

**සැලකිය යුතුයි.**—(i) මෙම සහතිකවල මුල් සහතික පත්‍ර ඉදිරිපත් කලයුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුව හොත් පමණකි.

(ii) ඉල්ලුම් පත්‍ර සමඟ සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට යුද හමුද මූලස්ථානය වගකියනු නොලැබේ.

(ඉ) තැපැලේදී නැතිවුන, ප්‍රමාද වන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කැරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අවසාන මොහොත වනතුරු බලාසිටීමෙන් වන හානිය විඳ දරාගැනීම අයදුම්කරු සතුය.

(ඊ) ඉල්ලුම් පත්‍රය සමඟ ස්වකීය ලිපිනය ලියන ලද (මුද්දර නොගසන ලද) කවරයක් බහා එවනු ලැබුවහොත් පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු ලැබේ. එසේ නොමැති නම් ලැබුන බව දන්වනු නොලැබේ.

(උ) රජයේ සේවයේ යෙදී සිටින්නවුන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර, දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් එවිය යුතුය.

(ඌ) දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරණු ලැබ, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව මෙම කාර්‍යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවලට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරණ ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

(එ) ඉල්ලුම් කරුවනට අවශ්‍ය සුදුසු කම් නොමැති නම් මොනම හේතුවක් නිසාවත් ඉල්ලුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

(ඒ) සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුයයි තෝරාගනු ලබන ඉල්ලුම් කරුවන්, තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේ වියදමෙන්ම පැමිණ පෙනී සිටිය යුතුය. යථෝක්ත ඉල්ලුම් කරුවනට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය, හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(ඔ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසුයයි තෝරා ගන්නා ලද ඉල්ලුම් කරුවන්, වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේ වියදමෙන්ම කොළඹ පෙනී සිටිය යුතුය.

(ඕ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද හමුද තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණ වලින් පසු යුද හමුද නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය සෙබළුන්ගේ හෝ ඊට සමාන නිළ දරන්නන් වශයෙන් බඳවා ගන්නා අතර යුද හමුද මධ්‍යස්ථානයේ හෝ අන් තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස මාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ. උසස් පත්වීම් සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසු යථෝක්ත නිලයට උසස් කරණු ලැබේ.

(ක) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයාගේ කැමැත්ත පළමුකොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය හට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ග) තෝරා පත්කරගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශෙෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කල යුතුය.

(ජ) ඉල්ලුම් කරු රෙකමදරු කිරීමට කැමැති කෙනෙකු වේ නම් ඔහු විසින් යථෝක්ත ඉල්ලුම් කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම් කරුවකුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම් කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

(ට) යම් ඉල්ලුම් කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත් කරණු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු අනාවරනය වුනි නම් රාජකාරියෙන් පහකරණු ලැබීමටත් ඉඩ තිබේ.

යුද හමුද මූලස්ථානය,
තැ. පෙ. අංක 553,
කොළඹ, 1964 මාර්තු මස 14.

ආ. ආරියප්පෙරුම කපිතන්,
යුද හමුද ආඥපති වෙනුවට.

## නිත්‍ය භට සේනාවේ සෙසුනිළ පත්වීමක් පිළිබඳ වූ ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවිඩ කාර්යාලය :————.
4. ඉතා කිට්ටු පොලිස් ස්ථානය : ————.
5. උපන් දිනය :————. වයස :————.
6. ජාතිය :————.
7. ඉල්ලුම් කරණ තනතුර :————.
(නිවේදනයේ අ (1) වෙනි ඡෙදයේ දක්වා ඇති පරිදි ඒකකය හා පත්වීම සඳහන් කළ යුතුය
8. කලින් දරණ ලද සමාන පත්වීම් පිළිබඳ විස්තර, තනතුරු හා දින සහිතව :————.
9. යුද සේවයෙන් අස්වීමේ දී හෝ අස්කරනු ලැබීමේ දී චරිතය, (සේවා මුක්ත භටයෙක් නම් යුද සේවයෙන් අස්වීමේ දී හෝ අස්කරනු ලැබීමේ දී ලබාගත් සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.
10. මීට ප්‍රථම, යුද, නාවික, ගුවන් හා ස්වේඡා සේවක හමුදවල (යුද සේවය ඇතුළුව) දරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දින ඇතුළුව සම්පූර්ණ විස්තරය :————.
11. දින සහිත සමත් වූ විභාග විෂයයන් සමඟ :————.
(පාසැල් හෝ අධ්‍යාපන සහතික පිටපත් ඇමිනිය යුතුය)
12. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.
13. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටින රක්ෂාව :————.
14. මෙම නිවේදනයේ 4වෙනි ඡෙදයේ දක්වා ඇති පත්වීම් සඳහා සුදුසු කම් හා පලපුරුද්ද ඔබට තිබේ ද? ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය :————.
15. උස අඩි :———— අඟල් :————.
16. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු (මෙම නිවේදනයේ 6 ඡෙදයේ (ඩී) 3 බලනු මැනවි) :————.
17. ඉල්ලුම් කරු අත්සනින් කර සිටින ප්‍රකාශය :—
ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

3—677—64.3.20 දින අංක 13.992 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ගණකාධිකාරි හා සහකාර ගණකාධිකාරි ඇබෑර්තු

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගණකාධිකාරි සහ සහකාර ගණකාධිකාරි තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

**ගණකාධිකාරීන්**

වැටුප් හිණ —මසකට රුපියල් 400—30 යේ 10 හා 40 යේ 5—900.

සුදුසුකම් —පහත සඳහන් සුදුසුකම්වලින් කවර හෝ එකක් අයැදුම්කරුවන්ට තිබිය යුතුය :—

(1) ලංකා කාර්මික විද්‍යාලයේ ගණක ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමාව, ... ... ...
(2) එක්සත් රාජධානියේ හෝ ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍යම විභාගය, හෝ ...
(3) රජයේ ගණකාධිකාරි සේවා විභාගය ... ... ... ...

මේ සමග විධායක පදවියක වර්ෂ 3 ක පළපුරුද්දක් යටත්පිරිසෙයින්ම තිබිය යුතුයි.

ඇපය —මුදලින් රුපියල් 3,000.

**සහකාර ගණකාධිකාරීන්**

වැටුප් හිණ —මසකට රුපියල් 340—30—670.

සුදුසුකම් —පහත සඳහන් සුදුසුකම්වලින් කවර හෝ එකක් අයැදුම්කරුවන්ට තිබිය යුතුය :—

(1) ගණන් තැබීම විශේෂ විෂයයක් වශයෙන් ඇතිව වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උපාධියක් ;
(2) ගණන් තැබීම විශේෂ විෂයයක් වශයෙන් ඇතිව ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ;
(3) ලංකා කාර්මික විද්‍යාලයේ ගණක ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමා සඳහා වූ මධ්‍යම විභාගය ;
(4) වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍යම විභාගය ; හෝ
(5) සතොස සේවයේ II වැනි හා III වැනි ශ්‍රෙණිවල 10 වර්ෂයක් ගණකාධිකාරි අංශයක ගණන් තැබීමේ පළපුරුද්ද ;
විශාල වෙළඳ සංවිධානවල පළපුරුද්ද ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඇපය —මුදලින් රුපියල් 1,500.

මීට අතිරේක වශයෙන්, රජයේ ගෙවීම් ප්‍රමාණයන් අනුව ජීවන වියදම් දීමනා, විශේෂ ජීවන වියදම් දීමනා සහ ගෙවල් කුලී දීමනාවන් ගෙවනු ලැබේ. අර්ථසාධක ප්‍රතිලාභයද තිබේ. තෝරාගත් අපේක්ෂකයන්, සුදුසුකම් හා පළපුරුද්ද අනුව මේ වැටුප් හිණිවල සුදුසු පියවරක තබනු ලැබේ.

වයස දක්වෙන අයැදුම් පත්, චර්යාව පිළිබඳ සවිස්තර වාර්තා සහ සහතික පිටපත් සමඟ 7.4.64 ද හෝ ඊට පෙර සාමාන්‍යාධිකාරී වෙත ලැබෙන සේ එවිය යුතුය.

1964 මාර්තු 9 ද, කොළඹ 2,
චොක්සෝල් වීදියේ අංක 21, සතොසදීය.

සාමාන්‍යාධිකාරී.

3-629—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශය

### මොස්කව්හි පැට්‍රිස් ලුමුම්බා මිත්‍ර විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ශිෂ්‍යත්ව, 1964

අංකය : ශිෂ්‍ය/371

1964 සැප්තැම්බර් මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට පහත සඳහන් විෂයයන්හි ප්‍රථම උපාධි අධ්‍යාපනය සඳහා මොස්කව්හි පැට්‍රිස් ලුමුම්බා මිත්‍ර විශ්ව විද්‍යාලයය විසින් පිරිනමන ශිෂ්‍යත්ව 18 ක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

(අ) ගණය—සිවිල් ඉංජිනේරු ශිල්පය
යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය
ආකර ඉංජිනේරු ශිල්පය

(ආ) ගණය—ශස්‍ය විද්‍යාව
සත්ව විද්‍යාව පිළිබඳ ශිල්පය
ප්‍රායෝගික වෛද්‍ය ශිල්පය

(ඉ) ගණය—භෞතික විද්‍යාව
ගණිතය
රසායන විද්‍යාව

(ඊ) ගණය—ඉතිහාසය
සාහිත්‍යය
රුසියන් භාෂාව

(උ) ගණය ...අර්ථ ශාස්ත්‍රය
ආර්ථික සැලැස්ම
ජාත්‍යන්තර නීතිය

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—පහත සඳහන් අයගෙන් අයදුම් පත් භාරගනු නොලැබේ:–

(i) රජයේ සේවකයින්.
(ii) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හෝ රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් ආයතනවල සේවකයින්.
(iii) ලංකාවේ විශ්ව විද්‍යාලයයක දැනටමත් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්ෂ්‍යය 2.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් 1964 සැප්තැම්බර් මස සිට අවුරුදු 4–5 වන්නේය. වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් පමණක් අවුරුදු 5–6 වන්නේය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ සෝවියට් බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

**3. සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ආ) 1964.9.1 වැනි දිනට වයස අවුරුදු 17 ට නොඅඩු හෝ 30 ට නොවැඩි විය යුතුයි.
(ඉ) පහත සඳහන් සාමාර්ථයන්ද ඇතුළුව, වාර දෙකකට නොවැඩි ගණනකදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී විෂයයන් හයකින් වත් යටත් පිරිසෙයින් සමත් වී සිටිය යුතුයි :—

(අ) ඉල්ලුම් කරන්නේ (අ) ගණයේ පාඨමාලාවක් සඳහා නම් :—

| | |
|---|---|
| ශුද්ධ ගණිතය<br>ව්‍යවහාරික ගණිතය<br>උසස් ගණිතය | මේ විෂයයන් තුනෙන් එකක් සඳහා සම්මාන සාමාර්ථයයක්. |
| භෞතික විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| රසායන විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |
| සිංහල හෝ දෙමළ භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |

(ආ) ඉල්ලුම් කරන්නේ (ආ) ගණයේ පාඨමාලාවක් සඳහා නම් :—

| | |
|---|---|
| රසායන විද්‍යාව<br>තෘණ විද්‍යාව<br>සත්ව විද්‍යාව<br>ජීව විද්‍යාව | මේ විෂයයන් 4 න් දෙකක් සඳහා සම්මාන සාමාර්ථයයක්. |
| භෞතික විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |
| සිංහල හෝ දෙමළ භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |

(ඉ) ඉල්ලුම් කරන්නේ (ඉ) ගණයේ පාඨමාලාවක් සඳහා නම් :—

| | |
|---|---|
| ශුද්ධ ගණිතය<br>ව්‍යවහාරික ගණිතය<br>උසස් ගණිතය | මේ විෂයයන් තුනෙන් එකක් සඳහා සම්මාන සාමාර්ථයයක්. |
| භෞතික විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| රසායන විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |
| සිංහල හෝ දෙමළ භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |

(ඊ) ඉල්ලුම් කරන්නේ (ඊ) ගණයේ පාඨමාලාවක් සඳහා නම් :—

| | |
|---|---|
| ඉතිහාසය | ...සම්මාන සාමාර්ථයය |
| භූගෝල විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි සාහිත්‍යය | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |
| සිංහල හෝ දෙමළ භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |

(උ) ඉල්ලුම් කරන්නේ (උ) ගණයේ පාඨමාලාවක් සඳහා නම් :—

| | |
|---|---|
| ඉතිහාසය | ...සම්මාන සාමාර්ථයය |
| භූගෝල විද්‍යාව | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි සාහිත්‍යය | ...සම්මාන සාමාර්ථයය |
| ඉංග්‍රීසි භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |
| සිංහල හෝ දෙමළ භාෂාව | ...සාමාන්‍ය සාමාර්ථයය |

(**සංලක්ෂ්‍යය.**—ඉහත කී සුදුසුකම් වලට අමතර වශයෙන්, ඉගෙනීමට අදහස් කරන පාඨමාලාවට අදල විෂයයන්ගෙන් උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ සමත්වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත්ය :—

(අ) සෝවියට් රුසියාවට යාම සහ ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු ලංකාවට පැමිණීම සඳහා ගමන් පහසුකම්
(ආ) නොමිලයේ ඉගැන්වීම
(ඉ) ශිෂ්‍යත්ව දීමනාවක්
(ඊ) ශිෂ්‍ය නිවාසවල නේවාසික පහසුකම්
(උ) නොමිලයේ සෞඛ්‍ය ආරක්ෂාව.

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ලුමුම්බා මිත්‍ර විශ්ව විද්‍යාලයය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදරා සතුටුදයක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් සෝවියට් රුසියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු යි.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු ශිෂ්‍යත්වධාරීන්ට රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂෙප කළ හොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන් ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නො කරන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1964.4.4 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 3, " සිරිමතිපායේ " අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාර ගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතු ය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1964 මාර්තු මස 14 වැනිද,
කොළඹ 3, " සිරිමතිපායේ "
අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

3–757—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදව

### දන්ත වෛද්‍ය නිළධාරියෙකු සඳහා පුරප්පාඩුවක්

රාජකීය ලංකා නාවික හමුදවේ දන්ත වෛද්‍ය නිළධාරියෙකු ගේ පුරප්පාඩුවක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගන්නා ලද අපෙක්ෂකයාට වෛද්‍ය ලුතිනන් (දන්ත) කෙනෙකු වශයෙන් රාජකීය ලංකා නාවික හමුදවේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

**වැටුප් සහ දීමනා—**

3. (අ) තෝරාගන්නා ලද නිළධාරියා පත්කර ගන්නා විට ඔහුගේ පළපුරුදුකම් අනුව මෙහි පහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පාදයක් මත තබනු ඇත.

II වැනි ශ්‍රෙණිය—අවුරුද්දකට රු. 5,160 (360—9ක්) සහ (480—6ක්) රු. 11,280. රු. 11,280 දී වර්ෂ දෙකක ඇණහිටීම:

I වැනි ශ්‍රෙණිය—අවුරුද්දකට රු. 11,760 (480—3ක්) රු. 13,200.

(ආ) පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ—

(I) රජයේ නිවාසයක පදිංචි නොමැති නම් රජයේ ගණන් මිම් අනුව ගෙවල්කුලී දීමනා ගෙවනු ලැබේ.

(II) රජයේ වියදමින් කැම්පිම් සපයනු නොලැබේ නම් ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර රජයේ ගණන් මිම් අනුව ගෙවනු ලැබේ.

(III) සේවා දීමනා.—මසකට ලුතිනන් වරයෙකුට සහ ලුතිනන් කොමාන්ඩර් වරයෙකුට රුපියල් 180ක් සහ කොමාන්ඩර් වරයෙකුට රුපියල් 225 ක සේවා දීමනාවක් ගෙවනු ලැබේ.

(IV) නාවික හමුද වැටුප් සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා ඇති අයුරින් විශේෂඥතා වැටුප් ගෙවනු ලැබේ.

(V) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ. පළමුවෙන් සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා රු. 650කි. මීට අතිරේක වශයෙන් අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළපසු නිල ඇඳුම් දීමනාව වශයෙන් මසකට රු. 25ක මුදලක් ගෙවනු ලැබේ.

4. තෝරාගන්නා ලද අපෙක්ෂකයා විවාහකයෙක් නම්, විවාහක නිවාසයකට (ලබාදිය හැකි නම්) සහ බැට්මන් සේවය ද සඳහා මසකට රු. 75 ක දීමනාවකට ද හිමිකරුවෙක් වේ. අවිවාහක නම්, බැට්මන් සේවය ද සහිතව නිළධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබීමට සුදුස්සෙක් වේ.

5. තෝරාගන්නා ලද අපේක්ෂකයාට කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් හිමි වේ. සේවා කොන්දේසි, උසස් වීම් ආදිය ගැන වැඩිදුර විස්තර කොළඹ නාවික හමුද මූලස්ථානය පැමිණ බලාගත හැක.

6. අයදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරා ලිය යුතුයි.

(අ) ජාතිය.—අයැදුම්කරුවන් ලාංකිකයන් විය යුතු යි.

(ආ) වයස.—අයැදුම්කරුවන් 1964 අප්‍රෙල් මස 4 වන දිනට වයස අවුරුදු 32ට වැඩි නොවිය යුතු යි.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.—අයදුම්කරුවන්, එල්. ඩී. එස්. හෝ බී. ඩී. එස්. හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පරීක්ෂණ මණ්ඩලයකින් හෝ ලබා ගත් වෙනත් උසස් දන්ත වෛද්‍ය සුදුසුකම් ඇත්තකු විය යුතු අතර දන්ත වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියා පදිංචි වූවෙකු විය යුතු යි.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—අයදුම්කරුවන් නාවික හමුදවේ නියම කර ඇති පරිදි සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතු යි. පත්වීම ලැබීමට මත්තෙන් නාවික හමුදව විසින් පිළියෙළ කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

7. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව අයැදුම්පත් අත් අකුරින් ලිය 1964 අප්‍රෙල් මස 4 වන දින ට පෙර නාවික හමුදාධිපති, තැ. පෙ. 593 නාවික හමුද මූලස්ථානය කොළඹ කියා එවිය යුතුය. අයැදුම් පත බහ එවන කවරයේ " දන්ත වෛද්‍ය නිලධාරි තනතුරක් සඳහා අයැදුම්පත " යනුවෙන් සඳහන් කළ යුතුයි. අයැදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ.

8. රජයේ සේවයේ නියුක්තව සිටින නිළධාරීන් විසින් එවනු ලබන අයැදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු යි. තෝරා ගනු ලැබුවහොත් එම නිලධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතු ය.

9. අයැදුම් පත් සමග පහත සඳහන් ලිය කියවිලි වල පිටපත් ඉදිරිපත් කළ යුතු යි.—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තීය පිළිබඳ සහතිකය.

(ඇ) අයැදුම්කරු පෞද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් ගෙන් ලබා ගත් යටත් පිරිසෙයින්, චරිත සහතික දෙකක්.

10. ලැබෙන අයැදුම්පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, මූලික තේරීම් මණ්ඩලයක් මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

11. සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබූ අයදුම් කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනවා ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනවා ඇත. මේ සඳහා අයදුම් කරුවන්ට දැරීමට සිදුවෙන ගමන් වියදම් සඳහා ලංකාණ්ඩුව විසින් මුදල් ගෙවනු නො ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනුනොලබන අයදුම් කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

12. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූල ව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

ආර්. කදිර්ගාමර්,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

මූලස්ථානය, රා. ලං. නා. හ.,
තැ. පෙ. 593, කොළඹ 1
1964 මාර්තු මස 16 දින.

## රාජකීය ලංකා නාවික හමුදාව

### දන්ත වෛද්‍ය නිළධාරීන් සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ජාතිය (ලංකාවේ පුරවැසියෙකු නම්, උත්පත්තියෙන් ද නැතහොත් ලියාපදිංචිකරනු ලැබීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කරනු ලැබූවෙකු නම් ලියාපදිංචි කළ අංකය සහ දිනය සඳහන් කරන්න) : ————,
3. ලිපිනය, රාජකාරී : ————,
   පෞද්ගලික : ————,
4. උපන් දිනය : ————,
5. පහත සඳහන් පරිදි මව්පියන්ගේ විස්තර—

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | ලිපිනය |
|---|---|---|---|
| පියා ... | | | |
| මව ... | | | |

6. විවාහකද යන වග : ————.
7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ඔබ ලබා ඇති ක්‍රීඩා පිළිබඳ දක්ෂකම් : ————.
8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ලබාගත් විශේෂ දක්ෂකම් : ————.
9. මීට පෙර නිත්‍ය සන්නද්ධ සේවයක, ස්වේච්ඡා හට කණ්ඩායමක, ශිෂ්‍යභට කණ්ඩායමක හෝ බාලදක්ෂ සංවිධානයක සේවය කර තිබේ ද : ————.
10. මෙම නතතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ————.
11. මීට පෙර සන්නද්ධ සේවාවක ඇබෑර්තුවක් සඳහා ඉල්ලුම් කර තිබේ ද? එසේ නම් එහි ප්‍රතිඵල : ————.
12. ඔබේ පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ හෝ ජීවිතය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ සහ විශ්ව විද්‍යාලයේ නම | දිනය | | සමර්ථවූ පරීක්ෂණය |
|---|---|---|---|
| | ඇතුල්වීම | පිටවීම | |
| | | ... | |

13. විශ්ව විද්‍යාලය හැරයෑමෙන් පසුව නියුක්තව සිටි රැකියාවල් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවෙහි ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | ... | | |

14. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනය :————.

දිනය : ————.

————
අයදුම්කරුගේ අත්සන.

3–761/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ පාසල්වල සේවය කරන සිංහල වැඩබලන මුල් ගුරුවරුන්/වරියන් 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස් කිරීම

පහත සඳහන් සුදුසුකම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන සිංහල වැඩබලන මුල් ගුරු වරුන්/වරියන් 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස් කිරීමට ක්‍රියා කරන ලෙස මවිසින් සියලුම සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යාපන නිලධාරිවරුන්ට උපදෙස් දී ඇත :—

(1) 1964-3-1 දිනට රජයේ වැඩබලන මුල් ගුරු වරයකු/වරියක වශයෙන් අවුරුදු 6 මාස 6 ක හෝ ඊට වැඩි (නොකඩවා හෝ කඩින් කඩ) වැඩබලන මුල් ගුරු සේවයක් තිබිය යුතුය.

(2) 1964-3-1 දිනට පුහුණුවෙන් පසු අවුරුදු 6 ක රජයේ ගුරු සේවයක් හෝ එම දිනට 1 වැනි පෙළ ගුරු සහතික පත්‍රය (නුපුහුණු) ලැබීමෙන් පසු අවුරුදු 6 ක රජයේ ගුරු සේවයක් හෝ තිබිය යුතුය.

(3) 1960.7.21 වැනි දින රජයේ පාසලක සේවය කළ ගුරුවරයකු/වරියක විය යුතුය.

(උසස් කරනු ලැබීම සඳහා වැඩ බලන මුල් ගුරු වරයකුට/වරියකට ඉහත සඳහන් අංක (1), (2) සහ (3) යන සුදුසුකම් 3 ම තිබිය යුතුය.)

2. මේ සම්බන්ධව තවම දැනුම්දීමක් ලැබීනැති **ඉහත සඳහන් සුදුසුකම් ලත්** වැඩබලන මුල් ගුරු වරුන්/වරියන් වේතොත් තමන් සේවය කරන ප්‍රදේශයේ/දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන නිලධාරී වෙත **වහාම ඒ** බව දැන්විය යුතුය.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 මාර්තු මස 16 දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

3–806—64.3.20 න අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

1963 ජූලි මස 12 වැනි දින හා අංක 13,697 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කර ඇති ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ නිර්දේශ පත්‍ර අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති පරීක්ෂණ ක්‍රමය පහත දැක්වේ :—

1. ගිණුම්. (අ) ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි—X වන පරිච්ඡේදය හැර I වන කොටස.
   (ආ) පවත්නා අවුරුද්දේ ඇස්තමේන්තු. (නිදර්ශන : ඒවායේ සැකසුම, ආදායම් ශීර්ෂ ආදිය).
   (ඇ) කච්චේරිවලට පැවරී ඇති විශේෂ ගිණුම් පිළිබඳ ආඥාපනත්.

2. **රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා.** අපේක්ෂකයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථා සම්බන්ධයෙන් පරීක්ෂා කෙරෙනු ලැබේ.

3. **කාර්ය සංවිධාන සංග්‍රහය.** අපේක්ෂකයන් කාර්ය සංවිධාන සංග්‍රහය සම්බන්ධයෙන් පරීක්ෂා කෙරෙනු ලැබේ.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

1964 මාර්තු මස 13 වැනි දින,
මුදල් අමාත්‍යාංශයේදී ය.

3–723—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/60/11(ජී).

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1962 ජූනි

අංක 13,913 හා 1964.1.10 වැනි දින දරන, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ 1964.1.4 වැනි දින දරන නිවේදනයට වැඩිමනත් වශයෙනි. 1962 ජූනි 30 වැනි දින පවත්වන ලද යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂක, අපේක්ෂිකාවන් ද යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරාගෙන ඇති බැව් මෙයින් දනුම් දෙමි:—

| නම | ලිපිනය |
|---|---|
| ආරියලතා, මා. ව. (මෙනෙවිය) ... ... | ... බුස්ස, පිටිවැල්ල, '' සාගර සිරි '' |
| ඒකනායක, සැ. ... ... | ... අකුරැස්ස, හෝල්ලගොඩ, තිබ්බොටුවාව |
| කර්ලැයින්, ගා. හේ. ඉ. (මෙනෙවිය) ... | ... දොඩම්දූව, පින්කන්ද, '' ප්‍රින්ස් '' විද්‍යාලය |
| කර්ලැයින් නෝනා, දි. ග. (මෙනෙවිය) ... | ... පූවක්පිටිය, හිඟුරළ |
| කරුණාසේන, වි. ... ... | ... ගෝනපල හන්දිය, තලගල, මීපාගල හන්දිය |
| කිතුලෙගොඩ. සු. ... ... | ... කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසැල් ගොඩනැගිලි ශාඛාව |
| කුසුමාවතී, ම. කො. (මෙනෙවිය) ... | ... දෙහිවල, කවුඩාන පාරේ, අංක 192 |
| ශ්‍රේටා,රා. ජ. (මෙනෙවිය) ... ... | ... නුගේගොඩ, ජම්බුගස්මුල්ල, අළුත් පාරේ, අංක 272/6 |
| චන්ද්‍රලතා, වි. (මෙනෙවිය) ... ... | ... පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලය |
| චන්ද්‍රාවතී, ග. දේ. (මෙනෙවිය) ... | ... හොරණ, '' සෙන්සිරි '' |
| චාලට් පෙරේරා, වි. මු. (මෙනෙවිය) ... | ... මාතර, තොටමුණ, පන්සල වත්තේ, අංක 42/10 |
| ජයසූරිය, ම. තෝ. නි. මෙ. ප්‍ර. (මෙනෙවිය) ... | ... ඇල්පිටිය, කුරුඳුගහදෙනිය, '' රොක්ලන්ඩ් '' |
| ඩයස්, ම. ජේ. (මෙනෙවිය) ... ... | ... ජාඇල, කොටුගොඩ, රද්දොළුව |
| ද සිල්වා, අ. ඥ. (මෙනෙවිය) ... ... | ... අම්බලන්ගොඩ, '' සුලලිත '' වාණිජ විද්‍යාලය |
| ද සිල්වා, අ. සු. නෝ. ... ... | ... පානදුර, නල්ලුරුව, සද්ධර්මාරාම මාවතේ, අංක 5 |
| ද සිල්වා, උ. ලි. දේ. පි. බී. (මෙනෙවිය) ... | ... මහරගම, පරණ පාර, '' ඩියුක් '' වාණිජ විද්‍යායතනය |
| ද සිල්වා, පෙ. ව. ජ. රෝ. ... ... | ... බොරලැස්ගමුව, වේරහැර, ලං.ග.ම., සැපයීම් අංශය |
| ද සිල්වා, ස. හේ. ද. (මෙනෙවිය) ... | ... අම්බලන්ගොඩ, අළුත් පාරේ, '' සුලලිත '' වාණිජ විද්‍යායතනය |
| ධම්මවතී, හේ. දේ. (මෙනෙවිය) ... | ... අළුබෝමුල්ල, '' යසලත් '' |
| ධර්මදස, උ. දො. ... ... | ... බොරලැස්ගමුව, වැව පාරේ, අංක 682 |
| ධර්මරත්න, අ. ටි. ... ... | ... බණ්ඩාරගම, කොළමැදිරිය, මිල්ලනිය පාර |
| නන්දදස, රා. මහ. ... ... | ... කඹුරුපිටිය, '' සුනිල් වලා '' වාණිජ විද්‍යාලය |
| නරසිංහ, ල. ... ... | ... හලාවත, ජැටි වීදියේ, '' දිමුතු '' වාණිජ විද්‍යාලය |
| පියවතී, ක. (මෙනෙවිය) ... ... | ... තෙල්වත්ත, පැලවත්ත |
| පීරිස්, ති. මි. ඩැ. ... ... | ... දිවුලපිටිය, මඩිත්තගම |
| පෙරේරා, ජෝ. ජො. මි. (මෙනෙවිය) ... | ... අංගොඩ, කුඩාබුත්ගමුවේ, අංක 93 |
| පෙරේරා, ලො. පි. සු. ජ්‍රේ. (මෙනෙවිය) ... | ... අංගොඩ, ගොතටුව, පොල්කනත්තේ, අංක 901 |
| ප්‍රන්සිනා, ගො. ක. (මෙනෙවිය) ... | ... ඉමදූව, කෝදගොඩ, අද්දරවත්ත |
| මහින්දරත්න, ර. ග. ... ... | ... රාජගිරිය, නාවල, නාරාහේන්පිට පාරේ, අංක 53/1 |
| මුණසිංහ, දො. ඇ. ද. ... ... | ... පන්නිපිටිය, රුක්මලේ, අංක 63 |
| යාපා, ව. ද. (මෙනෙවිය) ... ... | ... පානදුර, කුරුප්පුමුල්ල |
| රූපවතී පෙරේරා, ග. (මෙනෙවිය) ... | ... මෝරොන්තුඩුව, නාන්දූව, අංක 36 |
| සිරිසේන, ප. බ. ... ... | ... කොළඹ 7, රීඩ් මාවතේ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |
| සිරිසේන, රා. ප. ... ... | ... ඇහැලියගොඩ, දංදෙනිය |
| සිල්වා, ව. මේ. හැ. පි. (මෙනෙවිය) ... | ... ජාඇල, වැලිගම්පිටිය, වේරලුගහවත්ත |
| සුමනපාල, ජ. ආ. ... ... | ... නුගේගොඩ, කැස්බෑව පාර, අංක 418, '' විජයසිරි '' වාණිජ විද්‍යායතනය |
| සෝමරත්න, ජ. ප. ... ... | ... යක්කල, පිටුවල්ගොඩ |
| හේමපාල, ග. ... ... | ... ඉංගිරිය, රජයේ රෝහල |
| ලියනගේ, ඌ. ලි. හේ. (මෙනෙවිය) ... | ... පේරාදෙණිය, පේරාදෙණිය හන්දිය, ගොඩගන්දෙණිය |

කීර්ති වීරක්කොඩි,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවටය.

1964 මාර්තු 11 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

3–601—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජාතික කලායතනය

**1964–65 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීම**

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමේ අයදුම් පත් 1964 අප්‍රේල් මස 15 දින දක්වා භාරගනු ලැබේ. එම අයදුම් පත් මෙම ආයතනයේ 1964-65 අධ්‍යයන වර්ෂයේ අත් පොතෙහි උපදෙස් අනුව සම්පූර්ණ කර එවිය යුතුයි. ආකෘති පත්‍ර සහ අත් පොත් 1964 මාර්තු මස 20 දින සිට අප්‍රේල් 10 දින දක්වා කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 46 දරණ මෙම දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් පුද්ගලිකව හෝ තැපැල් මගින් හෝ ලබාගත හැක.

ආකෘති පත්‍ර සහ අත් පොත් ඉල්ලා එවන සෑම ලිපියක් සමගම අයදුම්කරුගේ ලිපිනය සඳහන්, මුද්දරයක් නො ගැසූ හිස් දිග ලියුම් කවරයක් ද එවිය යුතුයි. (සැ. යු.—එම ලියුම් කවරයේ වම් කෙළවරේ තමන් ඇතුළත් වීමට අදහස් කරන පන්තියේ නම සඳහන් කළ යුතුයි.)

**ඇතුළත් කර ගන්නා පාඨමාලා (අ) චිත්‍රකලා හා ව්‍යවහාරික චිත්‍ර අංශය**

(I) ඇඳීම හා පින්තාරු කිරීම.

(II) ඇඹීම හා මූර්ති ශිල්පය.

(III) රෙදිපිළි.

(IV) ග්‍රැෆික් මෝස්තර හා වාණිජ චිත්‍ර කලාව.

(V) ත්‍රිමාණ මෝස්තර.

**සෙනසුරාද පන්ති**

(I) ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ සෙනසුරාද උසස් පන්තිය.

**ඡායාරූප පන්තිය**

(I) ඡායාරූප පිළිබඳ ඇවුරුදු සවස පන්තිය.

**(ආ) නැටුම් අංශය**

(I) උඩරට නැටුම්, උඩරට බෙර වාදනය හා ගායනය.

(II) පහතරට නැටුම්, පහතරට බෙර වාදනය හා ගායනය.

**සෙනසුරාද පන්ති**

(I) උඩරට නැටුම්, උඩරට බෙර වාදනය හා ගායනය පිළිබඳ සෙනසුරාද පන්තිය.

(II) පහතරට නැටුම්, පහතරට බෙර වාදනය හා ගායනය පිළිබඳ සෙනසුරාද පන්තිය.

හේ. පෙ. වීරසේකර,
ලේඛකාධිකාරී.

ශ්‍රී ලංකා ජාතික කලායතනය,
කොළඹ.

3–766—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ, පාර්සන්ස් පාරේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූල ස්ථානයේ ගුවන් හමුදාධිපති විසින් කටුනායක, සැපයීම් සහ නඩත්තු කඳවුරේ තිබෙන සුන්-බුන් වෙන් වෙන් වශයෙන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් වර්ෂ 1964 අප්‍රේල් මස 3 වෙනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

(අ) ඊයං සහ තඹ රාත්තල් 6,720 පමණ.

(ආ) ලෝහ මිශ්‍රණ රාත්තල් 10,300 පමණ.

ටෙන්ඩර් පත්‍රයක් ලබාගැනීම පිණිස කොළඹ, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් අංශයේ පාලක නිලධාරි සහ ගණකාධිකාරි තුමා වෙත රුපියල් පණහක (රු. 50) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. වර්ෂ 1964 අප්‍රේල් මස 2 වෙනි දින දහවල් 12.00 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

සියළුම ටෙන්ඩර් පත් පිටපතක් සමග මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "සුන්බුන් මිළයට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර කොළඹ, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ ගුවන් හමුදාධිපති වෙත එවිය යුතුයි. එක් එක් විෂයයක් සඳහා වෙන් වෙන් වශයෙන් මිළ ගණන් දක්විය යුතුයි. තවද එකිනෙක ද්‍රව්‍යයන් වෙනුවෙන් වූ වැඩිම ඉල්ලුම්කරුගේ මිළ ගණන් පිළිගනු ලැබේ.

පළමුවැනි ඡේදයේ සඳහන් කර ඇති ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරණ විට ටෙන්ඩර් ඉදිරිපත් කළ සියළු දෙනාටම පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. ටෙන්ඩර් පතක් ඉදිරිපත් කරන ලද කෙනෙකුට ටෙන්ඩර් පතක් පරීක්ෂා කිරීමට කැමැත්තක් තිබේ නම් ගුවන් හමුදාධිපතිට එය දැන්වූ විට ඉදිරිපත් කරණ ලද ඕනෑම ටෙන්ඩර් පතක අනු පිටපත පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

ඊ. ආර්. අමරසේකර,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදාධිපති.

3–787—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ලුණු දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 අප්‍රේල් මස 15 වෙනි දින සිට වර්ෂ 1964 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කොළඹ වරායේ චාප්පු ස්ථානයේ සිට නාරාහේන්පිට ලුණු ගබඩාවට ගෝනිවල අසුරන ලද ලුණු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ වානිජ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 අප්‍රේල් මස 1 වැනි බදාදා පස්වරු 2 වන තුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1964 මාර්තු 31 වෙනිදා පස්වරු 2 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 200 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ලුණු කොමසාරිස් කාර්යාලයේ මුදල් බඳින්නේ නම් ලුණු කොමසාරිස් නමට මුදල් පත් ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ලුණු කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

1964 ක්වූ මාර්තු මස 20 වෙනි දින,
කොළඹ.

3–681—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ගමනා ගමන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964 අප්‍රියෙල් මස 22 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ඇදගෙන යන බෝට්ටුවක් සපයා භාර දීම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1964 අප්‍රියෙල් මස 22 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කායභීලයේදී පරීක්ෂා කළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් කායභීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 අප්‍රියෙල් මස 20 වෙනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරායේ කොමසාරිස්.

1964.3.20,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

3–700—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964 මැයි මස 20 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට වෑන් රථ දෙකක් සහ ලොරි දෙකක් සපයා භාර දීම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1964 මැයි මස 20 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් කායභීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 මැයි මස 18 වෙනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරායේ කොමසාරිස්,

1964.3.20,
කොළඹ, වරාය කොමිෂන් කායභීලයේදීය.

3–699—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### මෝටර් වාහනයක් සැපයීම

පහත සඳහන් විස්තරවලට අනුකූලවන මෝටර් වාහනයක් සැපයීම සඳහා ටෙන්ඩර් වර්ෂ 1964 අප්‍රේල් මස 17 වැනි දින පෙරවරු 10.30 දක්වා කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

**මෙහි සඳහන් විස්තර :** ටොන් 5, 140″—160″ වීල්බේස් පෝවඩ් කොන්ට්‍රෝල් චැසිය, නිෂ්පාදකයින්ගේ කැබ්එක සහිතව, ඉස්සරහ විදුරුවේ වයිපර දෙකකින් යුතු, සුවපහසු ආවරණයෙන් යුතුව, වෙනස් කළ හැකි පරිදි රියදුරු අසුනක් සහ තවත් මගියෙකුගේ අසුනක් සහිතව, වේගය සහ සැතපුම් දක්වන මීටර, ඉස්සරහ සවි කොට ඇති, සිලුවු තෙල් මාපකය, උෂ්ණ මාපකය, ඇමීටර් සහ වැකියුම් මාපකය, චාජ් නොවන බව දක්වන පහන, එළිය හා අඩ එළිය විහිදුවීමේ ස්විච්, සුක්කානම් පොල්ලේ සවිකොට ඇති බොත්තම තද කිරීමෙන් නලාව ශබ්දවන උපකරණය, ද්විත්ව වායු-ශබ්ද නලාව, රැස් විහිදුවන දිසා සංඥා පෙර සහ පසු සවිකළ. නැවැත්වීම පෙන්නුම් කරන පහන්, පසුපස සවි කළ පහන් දෙකක්, රිය අංකය සඳහා ලාම්පුවක්, වෝල්ට් 12/6 බැටරිය, පංකා එකෙකින් වායු භ්‍රමණය ඇති ජෙනරේටරය. බී.එච්.පී. වේගය 80-90 දක්වා වර්ධනය වන සාමාන්‍ය වශයෙන් ආර්. පී. ඇම්. 2400 පමණ ඩීසල් ඇන්ජිමකින් යුතු, පෙර හා පසු ෂොක් ඇබ්සෝබර සහිත, පසු පස ආධාර ස්ප්‍රිං තහඩු ඇති, නිෂ්පාදකයින්ගේ ආවුද කට්ටලයකින් යුතු ප්ලයි 10 ටයර සහ වැඩිමනත් රෝදය සහ ටයරය සහිතව.

2. ඉහත සඳහන් විස්තරවලට අනුකූල නොවූ, වාහන ගෙන්වීම කරන ටෙන්ඩර්කරුවන් එවැනි වාහනවල සම්පූර්ණ විස්තර දක්වා මිල ගණන් සඳහන් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. සීල් තබන ලද කවරයක බහාලන ලද ටෙන්ඩරය ලියුම් කවරයේ වම් අත ඉහළ කොනේ "මෝටර් වාහනයක් සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, කියා එවිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරී තැන්පත් ඊ. එල්. ඩබ්ලිව්. දහනායක මහතාට භාරදී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේම ටෙන්ඩර් පෝර්මවල පිට පත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර්කරුවන් විසින් මුලු වාහනය සඳහාම ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය. ඉලක්කමෙන් හා වචනවලින් පැහැදිලි ලෙස මිල ගණන සඳහන් කොට (තීරු බදු රහිතව වාහනය ගෙන්වීමට පිළියෙල යොදාගත හැකි බැවින්) ලංකාවේදී ගෙවිය යුතු තීරු බද්ද එකතු කළ විට මිල ප්‍රමාණයද, තීරු බද්ද නොමැතිව මිල ප්‍රමාණයද වශයෙන් වෙන් කොට දැක්විය යුතුයි. නමුත් බන්ධනාගාර කොමසාරිස් තැන විසින් නියම කළ හැකි, කොළඹදී බාරදීම සඳහා ලැබිය යුතු අනිකුත් සියලුම අය කිරීම් එහි ඇතුළත් විය යුතුය. තීරු බදු රහිත මිල ප්‍රමාණය මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලය මගින් බැර ගතහොත් ටෙන්ඩර්කරු විසින් බඩු අස්කර ගැනීමේ ප්‍රමාද නිසා, දෙවැනි වර ගුදම් කුලී සහ අනිකුත් වරායේ ගෙවීම්, ටෙන්ඩර්කරු විසින්ම දැරිය යුතු බව පැහැදිලිවම තේරුම් ගත යුතුය.

7. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර් කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් මුලුමනින්ම රජය වෙත තබාගනු ලැබේ.

9. ඉහත සඳහන් සියලුම කොන්දේසි නිසියාකාර සම්පූර්ණකොට නොමැති කිසියම් ටෙන්ඩරයක් සැලකිල්ලට භාජනය කරනු නො ලැබේ.

10. ටෙන්ඩර් භාරගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාරදුන හොත් එම නිවේදනය ලැබුණා ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

11. භාරදී ඇති ටෙන්ඩර අස් කර ගැනීම සඳහා ටෙන්ඩරකරුවනට අවසර දෙනු නොලැබේ. කිසියම් ජයග්‍රාහක ටෙන්ඩරකරුවෙකු විසින් ටෙන්ඩරය භාරගත් බවට දෙනු ලබන ලියවිල්ලේ සඳහන් කාලය තුළ වාහනය බාර දීමට අපොහොසත් වුවහොත් ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරිය අයගේ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක්, වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළි නොගෙන ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුය.

13. මෙම කොන්ත්‍රාත්තුව පවත්නා කාලය තුළ, කොන්ත්‍රාත්කරු ලංකාවේ නීතිවලට බැඳී සිටිය යුතුය.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලිපිනවල වෙනස්වීම් දැනුම් දිය යුතුය.

15. වැඩි දුර විස්තර මෙහි පහත අත්සන් කළ අයගෙන් ලබාගත හැක.

16. 1964 අප්‍රේල් මස 17 වැනි දින පෙරවරු 10.35 ට කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කාර්යාලයේදී සියලුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1964 මාර්තු 16 වැනිද,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේදී ය.

3–794—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ අර්ධ ස්ථිර කඳවුරට ජලය සැපයීම (ආර්. ඇල්. 5) සඳහා ටෙන්ඩර් පත් 1964.4.15 බදාදා පෙරවරු 11 දක්වා උ.මැ.කො., ප්‍රා.වා.ඉ., අනුරාධපුරය, විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964.4.10 වැනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන ව්‍යාපාරයේ (තඹුත්තේගම) වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝරම් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම පිණිස වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝරම් නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිණුම්, වැඩ පිළිබඳ සැලැසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

කො. සී. නී. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරු, රාජාංගන ව්‍යාපාරය.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 64. 3. 6 දින දීය.

3–605—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහියංගනය උප කොට්ඨාශය

මහියංගනය උප කොට්ඨාශයේ කැරගොඩ ව්‍යාපාරය යටතේ වාරිමාර්ග පහසුකම් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රේල් මස 15 වෙනි බදාදා පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. 1964 අප්‍රේල් මස 10 වෙනි සිකුරාදා වන තෙක් (එදිනත් ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා උප කොට්ඨාශය භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් උප කොට්ඨාශ භාර නිලධාරිතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 30,000කට හෝ ඊට වැඩි වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරිතැනගෙන් ලබාගත හැකිය.

එච්. ඩී. සී. ගුණවර්ධන,
උප කොට්ඨාශ භාර නිලධාරි,
මහියංගනය උප කොට්ඨාශය.

1964. 3. 9 වන දින,
මහියංගනය.

3–634—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මිනිපේ උප කොට්ඨාශය

(1) මිනිපෙ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරයේ ඇල වේල්ලෙහි බොරළු සැපයීම සහ ක්‍රමවත්ව ගොඩ ගැසීම සහ (2) සැ. 12 අඩි 4,000 සිට සැ. 13 අඩි 1,220 දක්වා ඇල හැරවීමෙහි පස් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රියෙල් මස 15 වෙනි දින පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙළෙහිම එහිදී සිදුකෙරේ.

2. අංක 1 දරණ කොන්ත්‍රාත් වැඩය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 42,000 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනටද අංක 2 දරණ කොන්ත්‍රාත් වැඩය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට ද මේ වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1964 අප්‍රියෙල් මස 14 දින තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මිනිපේ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන වැඩ විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ජේ. ඒ. ජේ. ජයසූරිය,
මිනිපේ වාරිමාර්ග ඉංජිනේරු තැන,
මිනිපේ උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය, මිනිපේ,
1964 පෙබරවාරි 21 දින දීය.

3–665—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නුවරඑළිය උප කොට්ඨාශය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය උප කොට්ඨාශයට අයත් පහත දැක්වෙන වැඩ සඳහා මහනුවර මධ්‍යම කොට්ඨාශය බාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1964 අප්‍රියෙල් මස 15 වෙනි දින පූ.භා. 10 දක්වා ටෙන්ඩර් පත් බාර ගනු ලැබේ ;—

| | කොන්ත්‍රාත්කරුගේ ලියා පදිංචි ප්‍රමාණය රුපියල් | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් |
|---|---|---|
| (1) කීනවල ඇල ව්‍යාපාරය ... ... | 40,000 ... | 50 |
| (2) මානගංවැටිය ඇල ව්‍යාපාරය ... ... | 25,000 ... | 50 |

1964.3.20 වෙනි දින සිට 1964.4.11 වෙනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී නුවරඑළිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ, ඒවායේ වටිනාකම හා ඒවායේ වැඩ සුදුසු ලෙස ප්‍රගතියේ ඇති බැව් දැක්වෙන ප්‍රකාශයක් එම භාර ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා නුවරඑළියේ වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්ාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

තවද ඉහත සඳහන් වැඩ සඳහා අවශ්‍ය සිමෙන්ති, කොන්ක්‍රිට් පයිප්ප සහ යකඩ. දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ.

ඒ. ඇස්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
නුවරඑළිය උප කොට්ඨාශය.

3–551—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කවුඩුල්ල උප කොටස යටතේ කාමර අටේ අවිවාහක නිළධාරීන්ගේ ස්ථිර නිවාසයක් සෑදීම සඳහා 1964.4.21 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ. රු. 30,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

2. ටෙන්ඩර් පෝරම දෙපිටපතකින් යුක්තව සම්පූර්ණකොට එවිය යුතුය. මේ සම්බන්ධයෙන් සියලුම විස්තර කවුඩුල්ල උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

3. 1964.4.3 වෙනි දින සිට 1964.4.17 වෙනි දින දක්වා කවුඩුල්ල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරුතැන ගෙන් ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. එක් එක් ටෙන්ඩරයක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු. 50ක් කවුඩුල්ල උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත තැන්පත් කළ යුතුයි.

4. මොනයම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත්කරුවන් වෙත රජයේ ආවුද දෙනු නොලැබේ. මෙම වැඩ සඳහා සිමෙන්ති පමණක් දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත්කරුට සපයනු ලැබේ.

ඒ. එෆ්. ඩයස් අබේසිංහ,
කවුඩුල්ල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරුතැන.

මින්නේරිය, 1964.3.13 වෙනි දින දීය.

3–688—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාතීමේන්තුව

### මන්නාරම උප කොට්ඨාශය

ව්‍යාඞිකුලම් යෝජනා ක්‍රමය යටතේ ඇති ඉඩම්වලට වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රේල් මස 14 වෙනි අඟහරුවාදා, පෙරවරු 10 දක්වා වවුනියාව උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාතීමේන්තුවේ රු. 40,000කට හෝ, ඊට වැඩි ගණන කට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 අප්‍රේල් මස 4 වෙනි දින සිට 1964 අප්‍රේල් මස 10 වෙනි සිකුරාදා තෙක් (දෙදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී, මුරුංකන් හි පිහිටි මන්නාරම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීලයෙන් ලබා ගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී, ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන් ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර් ගැන සියළුම වැඩ විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායසීලීය වේලාවන් තුළ දී වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන—මන්නාරම උප කොට්ඨාශය.

මුරුංකන්, 1964.3.11 දින දීය.

3–687—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

යාපනය උප කොටසේ ඉරණමඩු ව්‍යාපාරයේ දකුණු ඉවුරට ලඟා වීමේ පාලමට යාබද පැන්නුම් පාලම තැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත්, කොළඹ, තැ. පෙ. අංක 500, මහලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 අප්‍රියෙල් මස 21 වැනි කුජ දින පූර්වභාග 10 වන තෙක් භාර ගනු ලැබේ.

වාරිමර්ග දෙපාර්තමේන්තුවේ රු. 80,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ යන්ත්‍ර ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

උතුර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම, අනු පිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් සියයක (රු. 100) ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාල වේලාවන් තුල 1964 අප්‍රියෙල් මස 17 වැනි කිවි දින හෝ ඊට පෙර උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් පෝර්ම ලබාගත හැක.

මේ ගැන වැඩි විස්තර උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එන්. පෙරියතම්බි,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1964 මාර්තු මස 11 වෙනි දින,
කොළඹදීය.

3–690—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ ප්‍රධාන දකුණු ඇලේ ට්‍රැක් 3ට වාරිමාර්ග පහසුකම් ඇතිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 28 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘතකිරීම එවේලේම සිදුකෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000 කට හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැක.

1964 අප්‍රේල් මස 17 වැනි දින සිට 1964 අප්‍රේල් මස 24 වැනි දින දක්වා කාර්යාල වේලාවතුලදී හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත් පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද, නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම ලබාගැනීමේදී රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතුය.

මේ ටෙන්ඩරය ගැන සියලුම තොරතුරු, වැඩ විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර, යනාදිය කාර්යාල වේලාවතුලදී වාරි මාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැක.

ජේ. එච්. හෙන්ස්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

1964.3.4 වැනි දින,
මකුල්පොත දීය.

3–770—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හම්බන්තොට උප කොට්ඨාශය

ඌරුබොක්ක ඔය ව්‍යාපාරයේ, හුන්නකුඹුරේ දොර පහේ අමුණක් සෑදීම සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රේල් මස 28 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ල දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 අප්‍රේල් මස 24 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන වැඩ විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. කුලසේගරම්,
වාරිමාර්ගඉංජිනේරු.
හම්බන්තොට උප කොට්ඨාශය.

හම්බන්තොට,
1964 මාර්තු මස 12 දින දීය.

3–768—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොටස

යාපනය උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964.4.14 වන අඟහරුවාද පෙරවරු 10.00 දක්වා වව්නියාවේ, උතුරු කොබසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහි දී සිදු කෙරේ.

| වැඩ පිළිබඳ විස්තර | | ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| (අ) අක්කරායන්කුලමේ වම් ඉවුර ප්‍රධාන ඇල යටතේ අංක 2 දරණ බෙදු හැරීමේ ඇල තැනීම | ... | 45,000 | ... | 50 |
| (ආ) කරියාලයි නාගපදුවාන් ව්‍යාපාරයේ 1 වන යායේ දකුණු ඉවුර ප්‍රධාන ඇල තැනීම ... | ... | 45,000 | ... | 50 |
| (ඇ) කාරියාලයි නාගපදුවාන් ව්‍යාපාරයේ 1 වන යායේ අංක 1 දරණ බෙදහැරීමේ ඇල සහ ක්ෂෙත්‍ර ඇලවල නිර්මානයන් ඉදිකිරීම ... ... ... | ... | 25,000 | ... | 25 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964.3.23 වන සඳුදා සිට 1964.4.10 වන සිකුරාද වන තෙක් කාර්යාලීය වේලාවන් තුළදී කිලිනොච්චියේ, යාපනය උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් පිළියෙල කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර වැඩය සඳහා වූ ටෙන්ඩර් තැන්පත් මුදල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩ සඳහා වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුළදී ඉහත කී වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග කාර්යාලය,
කිලිනොච්චිය, 1964.3.12.

අ. වෙල්ලප්පා,
වාරිමාර්ග ඉංජිනේරු, යාපනය උප කොටස.

3-774—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්හ දෙපාර්තමේන්තුවේ සේවයට අයෝග්‍ය යන්ත්‍ර විකිණීම—සී. කොටස

කොළඹ තැපැල් පෙට්ටිය අංක 500 දරණ ස්ථානයේ, ඉඩම් වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලානේ යාන්ත්‍රික අංශයේ ගබඩාවේ තිබෙන පහත සඳහන් සේවයට අයෝග්‍ය යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ටැන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

| අංක | විස්තරය | රෙ. අංකය | දෙ. අංකය | ගණන |
|---|---|---|---|---|
| 1. | ටොන් $3\frac{1}{2}$ ඩොජ් ලොරිය ... ... | සී.ඊ. 4345 ... | අයි.ඩී.ඇල්. 46 ... | එකයි |
| 2. | ටොන් $3\frac{1}{4}$ පෝඩ් වී. 8 ලොරිය ... ... | සී.ඊ. 2716 ... | අයි.ඩී.ඇල්. 54 ... | එකයි |
| 3. | හො. 15 ඩොජ් ලොරිය ... ... | සී.ඊ. 2695 ... | අයි.ඩී.ඇල්. 55 ... | එකයි |
| 4. | ටොන් $3\frac{1}{2}$ ඩොජ් ලොරිය ... ... | සී.ඊ. 7465 ... | අයි.ඩී.ඇල්. 61 ... | එකයි |
| 5. | එම ... ... | සී.ඊ. 5725 ... | අයි.ඩී.ඇල්. 62 ... | එකයි |
| 6. | එම ... ... | සී.ඊ. 5724 ... | අයි.ඩී.ඇල්. 75 ... | එකයි |
| 7. | එම ... ... | සී.ඊ. 5039 ... | අයි.ඩී.ඇල්. 78 ... | එකයි |
| 8. | පෝඩ් වී. 8 ටිපර් රථය ... ... | සී.ඊ. 8175 ... | අයි.ඩී.ඇල්. 91 ... | එකයි |
| 9. | ටොන් 5 මැක් රථය ... ... | සී.ඇල්. 2881 ... | අයි.ඩී.ඇල්. 107 ... | එකයි |
| 10. | එම ... ... | සී.වී. 5379 ... | අයි.ඩී.ඇල්. 108 ... | එකයි |
| 11. | එම ... ... | සී.වී. 4773 ... | අයි.ඩී.ඇල්. 109 ... | එකයි |
| 12. | එම ... ... | සී.වයි. 8789 ... | අයි.ඩී.ඇල්. 110 ... | එකයි |
| 13. | එම ... ... | සී.වී. 4775 ... | අයි.ඩී.ඇල්. 115 ... | එකයි |
| 14. | එම ... ... | සී.වී. 4776 ... | අයි.ඩී.ඇල්. 116 ... | එකයි |
| 15. | ටොන් 3 පෝඩ් ලොරිය ... ... | සී.ඇල්. 511 ... | අයි.ඩී.ඇල්. 119 ... | එකයි |
| 16. | එම ... ... | සී.ඇල්. 749 ... | අයි.ඩී.ඇල්. 121 ... | එකයි |
| 17. | ටොන් $3\frac{1}{2}$ පෝඩ් ලොරිය ... ... | සී.ඇල්. 1132 ... | අයි.ඩී.ඇල්. 126 ... | එකයි |
| 18. | එම ... ... | සී.ඇල්. 1098 ... | අයි.ඩී.ඇල්. 131 ... | එකයි |
| 19. | එම ... ... | සී.ඇල්. 1133 ... | අයි.ඩී.ඇල්. 133 ... | එකයි |
| 20. | ටොන් 5 මැක් ලොරිය ... ... | සී.වී. 5380 ... | අයි.ඩී.ඇල්. 137 ... | එකයි |
| 21. | ටොන් $3\frac{1}{2}$ පෝඩ් ලොරිය වී. 8 ... ... | සී.ඇල්. 1942 ... | අයි.ඩී.ඇල්. 155 ... | එකයි |
| 22. | එම ... ... | සී.ඇල්. 2068 ... | අයි.ඩී.ඇල්. 158 ... | එකයි |
| 23. | එම ... ... | සී.ඇල්. 2067 ... | අයි.ඩී.ඇල්. 165 ... | එකයි |
| 24. | පෝඩ් ටිපර් රථය ... | සී.ඇල්. 2344 ... | අයි.ඩී.ඇල්. 166 ... | එකයි |
| 25. | ඩොජ් ටිපර් රථය ටොන් 3 ... ... | සී.ඇල්. 2485 ... | අයි.ඩී.ඇල්. 176 ... | එකයි |
| 26. | එම ... ... | සී.ඇල්. 2892 ... | අයි.ඩී.ඇල්. 177 ... | එකයි |
| 27. | පෝඩ් ටිපර් රථය ටොන් 3 ... ... | සී.ඇල්. 6211 ... | අයි.ඩී.ඇල්. 189 ... | එකයි |
| 28. | හො. 30 ඩොජ් ලොරිය ... ... | සී.ඊ. 4553 ... | අයි.ඩී.ඇල්. 204 ... | එකයි |
| 29. | හො. 15 ඩොජ් ලොරිය ... ... | සී.ඊ. 4101 ... | අයි.ඩී.ඇල්. 208 ... | එකයි |
| 30. | ඔස්ටින් වර්ගයේ වතුර බවුසරය ... ... | අයි.සී. 1024 ... | අයි.ඩී.ඇල්. 271 ... | එකයි |
| 31. | එම ... ... | අයි.සී. 1711 ... | අයි.ඩී.ඇල්. 273 ... | එකයි |
| 32. | ඔස්ටින් වර්ගයේ ටොන් 5 ලොරිය ... ... | අයි.සී. 780 ... | අයි.ඩී.ඇල්. 276 ... | එකයි |
| 33. | එම ... ... | අයි.සී. 2024 ... | අයි.ඩී.ඇල්. 281 ... | එකයි |
| 34. | එම ... ... | අයි.සී. 1690 ... | අයි.ඩී.ඇල්. 282 ... | එකයි |
| 35. | එම ... ... | අයි.සී. 775 ... | අයි.ඩී.ඇල්. 283 ... | එකයි |
| 36. | එම ... ... | අයි.සී. 1317 ... | අයි.ඩී.ඇල්. 284 ... | එකයි |
| 37. | එම ... ... | අයි.සී. 911 ... | අයි.ඩී.ඇල්. 366 ... | එකයි |
| 38. | එම ... ... | අයි.සී. 910 ... | අයි.ඩී.ඇල්. 367 ... | එකයි |
| 39. | එම ... ... | අයි.සී. 2346 ... | අයි.ඩී.ඇල්. 368 ... | එකයි |

සෑම ටෙන්ඩරයක්ම එවිය යුත්තේ රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ සාමාන්‍යාධිකාරි තුමාගේ කාර්යාලයෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රයක ය. රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් යාන්ත්‍රික අංශයේ සාමාන්‍යාධිකාරි තුමාගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මෙම ආකෘති පත්‍ර 1964 අප්‍රේල් මස 10 වෙනි සිකුරාද වනතෙක් ලබාගත හැක. සෑම ටෙන්ඩර යක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කල යුතුයි.

ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම 1964 අප්‍රේල් මස 14 වෙනි අඟහරුවාද පෙරවරු 10 ට කොළඹ ගාලු මුවදෙර මහාලේකම් කාර්යාලයේ අංක 355 දරණ කාමරයේදී සිදුකරනු ලැබේ. ඒ අවස්ථාවේ ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

ඉහත සඳහන් යන්ත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලාන යාන්ත්‍රික අංශයේ ගබඩාවෙහි සෙනසුරාද දිනවල හැර සතියේ වැඩ කරන දිනයන්හි පෙරවරු 8.30 සිට පස්වරු 3.30 දක්වා පරීක්ෂාකර බැලීමට පුළුවන.

වැඩි විස්තර රත්මලාන යාන්ත්‍රික අංශයේ සාමාන්‍යාධිකාරී තුමා ගෙන් ලබා ගත හැක.

යාන්ත්‍රික අංශය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රත්මලාන,
1964 මාර්තු මස 16 දිනදීය.

යාන්ත්‍රික අංශයේ සාමාන්‍යාධිකාරි.

3-771—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතලේ උප කොට්ඨාශය

පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රේල් මස 15 වෙනි දින බදාදා පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

1. මැණික්දෙන වැව—ප්‍රතිසංස්කරණය කිරීම ... රු. 29,000.00

ඉහත සඳහන් වැඩය සම්බන්ධයෙන් ඉදිරියෙන් සඳහන් මුදලට හෝ ඉන් වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති.

1964 අප්‍රේල් මස 10 වෙනි සිකුරාදා තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් අංකය වෙනුවෙන් රුපියල් 50 ක තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදලක් තැන්පත් කිරීමට අවශ්‍ය නැත.

මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී එම ඉංජිනේරු තැනගෙන් දැනගත හැක.

සී. පූපාලසිංහම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතලේ උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
1964 මාර්තු මස 10 වැනි දින දීය.

3–765—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

### ඩීසල් ඉංධන වලින් ක්‍රියා කරවන රූම් පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්

පේරාදෙණියේ, ගන්නොරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, පහත සඳහන් දේවල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 10 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

විශේෂ නියමයෝ :—

"පැයකට ගැලොම් 1,500 ට නොඅඩු වතුර ප්‍රමාණයක් අඩි 250 ට නොඅඩු දුර ප්‍රමාණයකට පොම්පකළ හැකි ඩීසල් ඉංධන වලින් ක්‍රියා කරවන රූම් පොම්පයක්."

2. පේරාදෙනියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ, ප්‍රධාන ඉංජිනේරුගෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතකින් යුක්තව, අත්සන් කර, ලියුම් කවරයක බහා, සීල් තබා, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, යාන්ත්‍රික අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නෝරුව, පේරාදෙනිය, යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "රූම් පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. පේරාදෙණියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් පත්‍ර තැන්පත් කළ යුතුයි, නැතහොත් ලියා පදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි. ලියා පදිංචිකළ තැපෑලෙන් එවනු නොලබන ටෙන්ඩර්, ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් ටෙන්ඩර් භාර ගැනීමට බලය ලත් නිලධාරියා වන පේරාදෙනියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ පරිපාලන නිලධාරිට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "රූම් පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුනු බව ඒවා විවෘත කරණ දිනයේදීම සියළු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු පේරාදෙණියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් වහාම ඒ ගැන විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් විවෘත කරණ වේලාවේදී පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනය යටකී වේලාවේදි, පේරාදෙනියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේදී, ඒවා විවෘත කරණු ලැබේ. පේරාදෙනියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමඟ කටයුතු පිළියෙල කරගෙන, තම තමන් විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්වල අනුපිටපතක් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කළ යුතුයි. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් රජයට ඔහුගෙන් ලැබිය යුතු වෙනත් දේ ලබා ගැනීමට හානියක් නොවන සේ, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කොට ඔහුගේ නමද ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කරණු ඇත.

7. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකණු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ළකුණුකළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ. ටෙන්ඩර් කරණ ලද මුදල අකුරෙන් හා ඉලක්කමෙන් ලිවිය යුතුය. සැපයීම් සඳහා දක්වනු ලබන ගණන්, කොළඹ සිට දුම්රිය ගාස්තුවෙන් නිදහස්ව දැන්විය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරණ සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් දින 45 ටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබූවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් තැන්පත් කිරීමටත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූවිට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් රජයට ඔහුගෙන් ලැබිය යුතු වෙනත් දේ ලබාගැනීමට හානියක් නොවනසේ ඔහුගේ ඇප මුදල් රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් කරණු ලැබේ. ගිවිසුම් පත්‍රයට/බැඳුම්කරයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දැරිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය ආණ්ඩුව සතුවේ.

11. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

12. කෘෂිකර්ම අධ්‍යක්ෂට අවශ්‍ය වුවහොත්, ඇපකරුවෙක් හෝ ඇපකරුවන් ඉදිරිපත් කිරීමට පත්කරගනු ලැබූ කොන්ත්‍රාත්කරු සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩර්කරු විසින් එසේ නම් කළ ඇප කරු කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් අනුමතකළ හොත්, කොන්ත්‍රාත් කරුගේ වියදමෙන් ඔහුද ඇපකරයකට බැඳිය යුතුයි.

13. වැඩ පැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු හෝ එවැන්නකුගෙන් ටෙන්ඩරයක් භාරගනු හෝ නොලැබේ.

14. පිරිනමන ලද දේවල් සඳහා, ක්‍රියා කරවන්නාගේ අත්පොත, වැඩපලෙහි පාවිච්චිකළ යුතු අත්පොත්, සහ අමතර කොටස්වල මිළ දර්ශණයක්ද බලාගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් හැකිනම් ඉදිරිපත් කළ යුතුයි තවද, සාදන්නාගේ වගකීම් කාලය සහ නොමිලේ සේවා කාලයද සඳහන් කළ යුතුයි.

15. අසතුටුදායක වැඩ හෝ නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුනොකිරීම සඳහා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුවේ.

16. වැඩි විස්තර, පේරාදෙණියේ, ගන්නෝරුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරුගෙන් දැනගත හැක. විස්තර දැනගැනීමට අවශ්‍යවූවිට ඔහුගේ පදවි නාමයෙන් මිස පෞද්ගලික නාමයෙන් ඔහු ඇමතීම නොකළ යුතුයි.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණිය,
1954 මාර්තු මස 12 දා.

3–711—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දැව සැපයීම සඳහා ටෙන්ඩර්**

අංක 13,974 හා 1964.3.6 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම පහත සඳහන් අයුරු වෙනස් කර ඇත :—

"පේරාදෙනියේ ගන්නෝරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964.4.3 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් දැව සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ."

ඒ. ඊ. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙනිය,
1964 මාර්තු මස 12, දින.

3–712—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ, පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් විසින් 1964 අප්‍රියෙල් මස 17 වන සිකුරාදා පෙරවරු 9.30 දක්වා තලෙයිමන්නාරම් පිහිටි පොලිස් කඳවුරෙහි රඳවා ගනු ලබන නීති විරෝධී ආගාමිකයින්ට, 1964 මැයි මස 1 වන දින සිට 1965 අප්‍රේල් මස 30 වැනි දින දක්වා පිසින ලද කෑම සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පිහිටි පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් කාර්යාලයෙන් ලබාගන්නා ටෙන්ඩර් ආකෘති පත්‍ර (පිටපත් දෙකක්) වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. පිට පළාත්වල පිහිටි කච්චේරිවල හෝ කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් කාර්යාලයෙහි තැන්පත් කරන ලද රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සඳහා රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන්, 1964 අප්‍රියෙල් මස 9 වැනි දින දහවල් 12.00 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර ඉන්ස්පැක්ටර් ජනරාල් වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. ඒ. දිසානායක,
පොලිස් පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1, 1964 මාර්තු 16.

3–816—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් විසින් 1964 අප්‍රේල් මස 17 වන සිකුරාදා පෙරවරු 9.30 දක්වා කයිට්ස්හි පිහිටි පොලිස් නිරෝධායන කඳවුරෙහි රඳවා ගනු ලබන නීතිවිරෝධී ආගාමිකයින්ට, 1964 මැයි මස 1 වන දින සිට 1965 අප්‍රේල් මස 30 දින දක්වා පිසින ලද කෑම සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පිහිටි පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් කාර්යාලයෙන් ලබාගන්නා ටෙන්ඩර් ආකෘති පත්‍ර (පිටපත් දෙකක්) වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. පිට පළාත්වල පිහිටි කච්චේරිවල හෝ කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් කාර්යාලයෙහි තැන්පත් කරන ලද රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සඳහා රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1964 අප්‍රේල් මස 9 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර ඉන්ස්පැක්ටර් ජනරාල්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. ඒ. දිසානායක,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ—1, 1964 මාර්තු 16.

3–815—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**කිලෝවොට් 10 ජෙනරේටරයක් සැපයීම සඳහා ටෙන්ඩර්**

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් කිලෝවොට් 10 ජෙනරේටරයක් සැපයීම සඳහා ටෙන්ඩර් 1964.4.3 දින පෙ. ව. 11.00 තෙක් භාරගනු ලැබේ.

(2) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් 1964.4.2 වන දින දවල් 12 තෙක් ලබා ගත හැකි පෝරමයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. මෙම කාර්යාලයෙන් හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදිය) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රුපියල් 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

(3) රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

(4) ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "කිලෝවොට් 10 ජෙනරේටරයක් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කොට කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

(5) ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 30ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

(6) සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට සති 6ක් ඇතුළත දී ජෙනරේටරය කිරුළපොනේ මධ්‍යම වැඩපළට ගෙනවිත් භාරදිය යුතුය.

(7) සාර්ථක වූ ටෙන්ඩර්කරු ඇප ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර් කරුගේ නමද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

(8) කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1964.4.3 වන දින පෙරවරු 11.15ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

(9) කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂෙප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ බලය රජය සතුය.

(10) වැඩි විස්තර සඳහා ඉ. ස. අ. තැන විමසන්න.

සී. විස්වාසම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී,
කොළඹ 1, 1964.3.16.

3–817—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අංක 22 ශ්‍රී 2317 දරණ ලොරිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමත බල ගරාජයන්ගෙන් මිළ ගණන් කැඳවනු ලැබේ. කොළඹ 1, තැපැල් පෙට්ටිය 500, ඉඩම් කොමසාරිස් තුමාට 1964.4.25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස මිළ ගණන් එවිය යුතු වේ. අනිකුත් විස්තර කාර්යාලයෙන් ලබාගත හැක.

ආර්. එල්. ආනෝල්ඩ,
අතිරේක ඉඩම් කොමසාරිස්.

1964.3.16 දින,
කොළඹ මහලේකම් කාර්යාලයේදී ය.

3–812—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

මාන්කර්නි සහ පනිච්චන්කර්නි යන මඩකලපුව දිස්ත්‍රික්කය තුළ පිහිටි පොළොන්නරුව ඉඩම් සංවර්ධන කොට්ඨාශයට අයත් ව්‍යාපාර වලට අවශ්‍ය ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීයිම.

පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉහත දක්වා ඇති ව්‍යාපාරයන්ට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 3 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

(1) පොල්අතු (අඩි 7 කට දිගින් අඩු නොවූ අගල් 18 ක් පළල්වූ ඉරු දෙකේ පොල් අතු 1,000 බැගින්)
(2) අලු හුණු (බුසල් ගණනින්, බුසලක් රා. 44 ට අඩු නොවිය යුතුයි)
(3) තම්බාපු හුණු (බුසල් ගණනින්)
(4) කළුගල් (කියුබ් ගණනින්) අගල් 6"—9"
(5) තලාපු ගල් (කියුබ් ගණනින්) (3/4" සිට 2" දක්වා)
(6) පිළිස්සූ ගඩොල් ($8\frac{3}{4}" \times 4\frac{1}{2}" \times 2\frac{3}{4}"$—1,000 බැගින්) (පෝරණුව ව්‍යාපාරයේ සිට සැතැප්ම 5 කට වැඩි නොවිය යුතුයි)
(7) ගංගා වැලි (කියුබ් ගණනින්).

2. ගෙනවිත් භාරදීම සඳහා වෙන වෙනම මිළ ගණන් දක්විය යුතුයි.

(අ) වත්තෙන්, පෝරණුවෙන්, ගල්වලෙන් (ලොරිගෙන ගිය හැකිවිය යුතුයි)

(ආ) වැඩපළට.

3. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් මෙම කාර්යාලයේ හෝ කච්චේරියක හෝ ඒ ඒ ව්‍යාපාරයනට වෙන වෙනම රු. 50 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. 1964 අප්‍රේල් මස 2 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පෝර්මයන් නිකුත් කරනු ලැබේ.

4. පිළිගත් ටෙන්ඩර්කරු විසින් මා නියෝග කළ දින සිට සති දෙකක් ඇතුළතදී උපකරණ සැපයිය යුතුයි. යමෙක් එය පැහැර හැරියහොත් හෝ අසමත් වුවහොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නමද ආණ්ඩුවේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

5. කැමති ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන වේලාව වන 1964 අප්‍රේල් මස 3 වෙනි දින පෙරවරු 11 ට ඉදිරිපත් විය හැක.

6. වැඩි විස්තර පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

එම්. අයි. එම්. නලීර්,
ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව.

1964 මාර්තු මස 13 දින,
ඉඩම් සංවර්ධන කාර්යාලය,
පොළොන්නරුව.

3–814—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**ඛම්බලපිටිය මහල් නිවාස ක්‍රමයේ ගරාජ 36 ක් මහල් නිවාස 18 ක් බවට හැරවීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි**

ඛම්බලපිටිය මහල් නිවාස ක්‍රමයේ ගරාජ 36ක් මහල් නිවාස 18ක් බවට හැරවීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 අප්‍රියල් මස 10 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

රජයේ දෙපාර්තමේන්තුවල ගොඩනැගිලි කමර්ාන්ත වැඩ සඳහා රුපියල් 1,50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරණ ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් පැන වෙත රුපියල් 175 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1964 අප්‍රියෙල් මස 7 වෙනි අඟහරුවාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. ටී. ජී. ඒ. ද ෆොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1964 මාර්තු මස 14 වෙනි දින.

3–776—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

**අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට පිළියෙල කරන ලද ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය සැපයීම**

1964 මැයි මස 1 වෙනි දින සිට 1964 සැප්තැම්බර් මස 30 වෙනි දින (එම දෙදිනත් ඇතුළුව) දක්වා කාලය තුළ මෙහි පහත ඇති උපලේඛනයේ සඳහන් පරිදි පිළියෙල කරන ලද ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, එම ද්‍රව්‍ය විකිණීමට ලියා පදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් වලින් කොළඹ 1, මහා ලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 අප්‍රේල් මස 14 වෙනි දින පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙළවරේ එය කුමන සේවයක් සඳහා ද යන වග පැහැදිලි ලෙස ලියා, කොළඹ මහා ලේකම් කාර්යාලයේ අංක 155 දරණ කාමරයේ සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමාගේ ලිපිනයට එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර, කොළඹ මහා ලේකම් කාර්යාලයේ අංක 155 දරණ කාමරයෙහි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතිනම් ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. කෙසේ වුවද, ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමැති නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලය ලත් නිලධාරියා වන පළමුවන ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ සහකාර ලේකම්තුමාට පුද්ගලිකව භාර දිය හැකිය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාර දුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

4. 1 වැනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියළුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන්ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට වුවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනුපිටපතක් ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති සමග නියම කර ගත් වේලාවක පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත දක්වෙන උපලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි පිහිටි මගේ කාර්යාලයෙන් ලබාගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමග ඉදිරිපත් නොකෙරෙන තැන්පත් මුදල් බැංකුව භාර නොගන්නවා ඇත. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සිය 1964 අප්‍රේල් මස 10 වෙනි දින දවල් 12 ට පෙර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි පිහිටි මගේ කාර්යාලය වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුය. තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබාගැනීමට හැකි වන අන්දමින් කල්වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

6. කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි මගේ කාර්යාලයෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

කෝට්ටෙ පාර, කොළඹ 8,
1964 මාර්තු මස 9 වෙනිද.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස්.

### උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 64.5.1 සිට 64.9.30 (එම දෙදින ඇතුළුව) දක්වා කාල සීමාව තුළ අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට පිළියෙල කරන ලද ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා | රු. 500 ... | ටෙන්ඩර් වටිනාකමින් සියයට පහක් | 1964 අප්‍රේල් මස 14 වෙනිද |

3–618—64.3.20 දින අංක 13,992 දරණ ගැසට් පත්‍රය

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### අනුරාධපුරයේ රජයේ ආරෝග්‍ය ශාලාවේ ශල්‍යාගාරයට සහ සිහිනැති කරණ කාමරයට වායු සමන යන්ත්‍ර සැපයීම සහ සිහිටුවීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක් වූ මැයි මස 19 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1964ක් වූ මැයි මස 15 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964ක් වූ මැයි මස 19 වන අඟහරුවාදා පූ. භා. 10 ට ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ නො. 355හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
වැඩබලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ 10,
1964ක් වූ මාර්තු මස 20 දින දීය.

3–701—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### කිලෝවෝල්ට 11 සහ අඩවෝල්ට කර පරිණාමක සැපයීම

රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක් වූ ජූනි මස 23 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද; රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1964ක් වූ ජූනි මස 19 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964ක් වූ ජූනි මස 23 වන අඟහරුවාදා පූ. භා. 10ට ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ නො. 355හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
වැඩබලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ, 10,
1964ක් වූ මාර්තු මස 20 දින දීය.

3–702—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය

### හාඩ්බෝඩ් කම්හලක් පිහිටුවීම සඳහා

සම්පූර්ණ හාඩ්බෝඩ් කම්හලක් ලංකාවේ පිහිටුවීම සඳහා අවශ්‍ය වන යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ සැලැස්ම, සැපයීම, ඉදිකිරීම, ක්‍රියා කරවීම හා ඒ සඳහා විශේෂ ද්‍රව්‍ය සැපයීම සඳහා කොළඹ 7, බුලර්ස් පාරේ අංක 404 හි, පිහිටි වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, (තැ. පෙ. 570) විසින් 1964 ජූනි මස 20 වැනි සෙනසුරාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩරයේ කොන්දේසි සහ හාඩ්බෝඩ් කම්හල සඳහා අවශ්‍ය යන්ත්‍රාගාරයේත් යන්ත්‍රෝපකරණ හා විශේෂ ද්‍රව්‍යවලත් විස්තර සටහන්, ටෙන්ඩරය සඳහා රු. 250ක මුදලක් කොළඹ 7, වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ තැන්පත් කළ බව දැක්වෙන රිසිට් පතක් ඉදිරිපත් කළවිට, කොළඹ 7, බුලර්ස් පාරේ අංක 404 හි පිහිටි වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්ෂ (තැ. පෙ. 570) විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ මුදල, ටෙන්ඩරයේ කොන්දේසි අනුව ටෙන්ඩර් ඉදිරිපත් කළ සියළුම අවශ්‍ය ටෙන්ඩර් කරුවන්ටත් ටෙන්ඩර් පත්‍ර එවීමට නො හැකි වුව ද, ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පෙර ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, සංවර්ධන අධ්‍යක්ෂ වෙත ආපසු එවන ටෙන්ඩර්කරුවන්ටත්, ආපසු ගෙවනු ලැබේ.

3. ලංකාවේ සිටින විදේශීය රාජ්‍ය වල නියෝජිතයන්ගෙන් සහ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන පිට රට වල සිටින ලංකා රජයේ නියෝජිතයන්ගෙන් ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් අවශ්‍ය නැත.

4. වැඩි විස්තර කොළඹ 7, බුලර්ස් පාරේ අංක 404 දරන ස්ථානයේ වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්ෂගෙන් ලබා ගත හැකිය.

ඒ. අයි. මොහිදීන්,
සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 404, බුලර්ස් පාර,
තැ. පෙ. 570, කොළඹ 7.

3–671—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කොලොන්නාව, මීතොටමුල්ල, පන්සලහේනේ 1/ බැලිව් 6 වශයේ ගෙවල් 36ක් තැනීම

කොලොන්නාව, මීතොටමුල්ල, පන්සලහේනේ 1 බැලිව් 6 වශයේ ගෙවල් 36 ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 අප්‍රියෙල් මස 10 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

රජයේ දෙපාර්තමේන්තුවල ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 1,50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරණ ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 175 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1964 අප්‍රියෙල් මස 7 වැනි අඟහරුවාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. ඊ. ඊ. ඒ. ද පොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1964 මාර්තු මස 14 වෙනි දින.

3–777—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : ඇජ් ටී.සී/29/64.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ඇසිඩ් ඇක්තිල්සැලිසිලික් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට ඇසිඩ් ඇක්තිල්සැලිසිලික් ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 අප්‍රේල් 21 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ගාලු මුවදෙර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි 6 වැනි, ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1964 අප්‍රේල් 20 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබනලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමුවෙනි මහල, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදෙර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ ''ඇසිඩ් ඇක්තිල්සැලිසිලික් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1964.4.21 උදේ 10ට'' යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ, කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේනම්, සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ උප ලේකම් තැනවෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යනවග හා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර්පත් බාර ගැනීම් සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරුවෙත ඔහු විසින් නිකුත් කරණු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කළ යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විසින් 1949 අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්මේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදි සමූහ ආණ්ඩුව, ආදී රටවල් වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරනලද වෙළෙන්ඳන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරනලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයත් හිමි බව ඔප්පු කල යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්‍යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතාකල හැක්කේ **ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.**

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

**9. ටෙන්ඩර් කරුවන්වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමඟ නිකුත් කරන ටෙන්ඩර කොන්දේසිවල II වැනි ඡෙදය කෙරෙහි ටෙන්ඩර් කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරින්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡෙදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි.** ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.

10. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සැම ටෙන්ඩර් කරුවෙකු ඩම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍යනම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමඟ කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

ඇස්. ඥානසේගරම්.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ, 1964 මාර්තු 14 දින.

### උපලේඛනය

| විෂය | වර්ගය | ඇස්තමේන්තු කරන ලද උවමනා ප්‍රමාණය | උවමනා ඇහිරීම් |
|---|---|---|---|
| 1 ... | ඇසිඩ් ඇක්තිල්සැලිසිලික් (ඇස්ප්‍රින්) බී.පී. ක්‍රිස්ටලයින් පවුඩර් මැග්නීසියම් සල්ෆේට් බී.පී. | රාත්තල් 6,000 ... ... | තෙතමනයෙන් ආරක්ෂා වන පරිදි හොඳින් වැසූ රා. 1 බෝතල් වලින් |
| 2 ... | පෙනිටොයින් සෝඩියම් බී.පී. ග්‍රේ. $1\frac{1}{2}$ (මිග්‍රෑ. 100) ඩුයිපිල්ඩ් කැප්සියුල්ස් මිස ජෙස්ට්-සීල්ඩ් කුප්. නොවේ | කැප්සියුල්ස් 2,000,000 ... | හුලඟ නොයන, ස්කුරුප්පු මූඩි සහිත බෝතල් වල එකක කුප්පි 1000. බැගින් |
| 3 ... | ක්ලෝරම් තැනිකෝල් බී.පී.කුප්. එකක් මිලි ග්‍රෑ. 250ක් අඩංගුය ... | කැප්සියුල්ස් 1,200,000 | කෝක් සීල් කරන ලද ස්කුරුප්පු මූඩි සහිත බෝතල් වල හෝ හුලං නොයන ලෙස සීල් කරන ලද ටින් වල එකක කුප්. සියුල් 1000 බැගින්. |

බාරදීමේ ක්‍රමය :—විෂය 1–3 දක්වා ඇති භාණ්ඩයන්, ඉතා ආසන්න සමාන තොග 3කින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාරදිය යුතුයි. පලවෙනි තොගය ඇනයුම් කළ මාස 2ක් ඇතුළත දීද, ඉතිරි තොග දෙක ඉන්පසු එන මාස 2න් 2ට සැපයිය යුතුවේ.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස රජයේ ඉල්ලා සිටින්නේ නම්, සඳහන් කරන ලද මිල (මිල සහ කොළඹට ගෙනඒමේ ගාස්තුව) හා ඇහිරීම් සහ අනිකුත් සියලුම ගාස්තු සහිතව මිල, බඩු නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින්ද සඳහන් කළ යුතුවේ. නාවික මාරුවීම්වලට අවසර දෙනු නොලැබේ. මෙම සැපයීමේ සැම භාණ්ඩයක් හා භාජනයක ම '' ඔටුන්න ලකුණු '' සඳහන් විය යුතුයි.

3–791—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ1964 අප්‍රියෙල් 1 වනද සිට 1964 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලයකුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයෙහිදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව වන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩර් එකක්වත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇති ව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම, තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලෙඛනයෙහි 5 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, කුරුණෑගල '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලෙඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවොත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලෙඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් හෝ සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා අදහස් කරන මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලෙඛනයෙහි තුන්වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටු පස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම, පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

ඩබ්ලිව්. එස්. පෙරේරා,
කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි.

1964.3.4 දින,
කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

උපලෙඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන්: සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මස් | මාළු | කරවල | එළවළු |
| 1. මඩහපොල මාතෘ නිවාසය... | 100 ... | 300 ... | 64.3.26 දින ... පූ. භා. 10 | 150 ... | 100 ... | 150 ... | 600 ... | 200 ... | 300 ... | 400 ... | 1,150 |

3–522—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඇෆ්.ටී.බී/3/64.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කම්පනය ඔරොත්තු දෙන රෝග විනිශ්චය එක්ස්-රේ උපකරන ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්

කොළඹ සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත කම්පනය ඔරොත්තු දෙන රෝග විනිශ්චය එක්ස්-රේ උපකරණ ආදිය සැපයීම සඳහා 1964 ජූනි මස 23 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්, කොළඹ ගාලුමුවදොර මහ ලේකම් කාර්යාලයේ 'බී' ගොඩනැගිල්ලේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් (සැපයීම් අංශය) ලබාගත හැකි ආකෘති පත්‍රවල, දෙපිටපතින් ඉදිරිපත් කළ යුතුයි. මේ දැන්වීමේ 5 හා 6 යන නියමයන්ට අනුව ටෙන්ඩර් ආකෘති පත්‍ර 1964 ජූනි මස 22 වෙනි දින පෙ. ව. 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත නිකුත් කරනු ලැබේ.

3. " 1964රේ ජූනි මස 23 වෙනි දින පෙ. ව. 10ට නියමිත කම්පනය ඔරොත්තු දෙන රෝග විනිශ්චය එක්ස්-රේ උපකරණ " ආදිය සැපයීම සඳහන් ටෙන්ඩර් පත්‍රය " යි වම් පැත්තේ මුදුන් කෙළවරේ සඳහන් කර මුද්‍රා තබන ලද කවරයන්හි බහාලන ලද ටෙන්ඩර් කොළඹ ගාලුමුවදොර මහලේකම් කාර්යාලයේ පළමුවැනි මාලය, තැ. පෙ. 500, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය.

4. ටෙන්ඩර්, කොළඹ ගාලුමුවදොර මහා ලේකම් කාර්යාලයේ සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ අංක 155 දරණ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ ලේඛන ගත තැපෑලෙන් එවීම හෝ නියෝජිතයන් විසින්, ඉහත 3 වෙනි ඡේදයෙහි සඳහන් ලිපිනයෙහි සිටින එවැනි ටෙන්ඩර් භාර ගැනීමට බලය ලත්, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ සහකාර ලේකම් වෙත ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයත්, සැපයීමේ විස්තරත් සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර් පුද්ගලිකවම භාර දිය හැක.

5. කච්චේරියකදී (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේදී මුදල් රු. 100 ක් තැන්පත් කළ බවට ලදුවක් ඉදිරිපත් කළ විට කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මෙරට ටෙන්ඩර් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ, ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි.

6. ඇල්බේනියාව, අවුස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහාණ්ඩුව, චෙකොස්ලෝවැකියාව, තායිවාන්, ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හංගේරිය, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහාණ්ඩුව, ස්පාඤ්ඤ, එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව හා වියට්නාම් සමූහාණ්ඩුව වැනි ලාංකික කළ මාර්ගවලින් බඩු ගෙන්වා සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් ආනයන පාලක තැන විසින් නිකුත් කළ වලංගු සාමාන්‍ය ආනයන බලපත්‍ර ඇති ලියාපදිංචිවූ ලාංකික වෙළෙන්දන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කරන්නන් මෙවැනි බලපත්‍ර තමන් ලබා ඇති බව ඔප්පු කළ යුතුයි.

7. දෙවෙනි ඡේදයේ දී ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම් අංශය) කාර්යාලයේ ලිපිනයෙන් ටෙන්ඩර් කොන්දේසි, නියමයන් හා වෙනත් විස්තර ලබාගත හැකිය. මේ කාර්යාලයේ දී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර, කොන්දේසි ආදිය **භාවිතා කළ හැක්කේ මෙරට ටෙන්ඩර්කරුවන් විසින් පමණය.**

8. ටෙන්ඩර්කරුවන් විසින් මෙහි පළමුවැනි ඡේදයේ සඳහන් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් මාස දෙකක් තුළ ස්වකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුය.

9. මේ ටෙන්ඩර් පත්‍රය පිළිබඳ කොන්දේසි, ෂෙඩියුල් පත් හා අනෙක් සියළු විස්තර මහා බ්‍රිතාන්‍යයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ, ඉතාලියේ, පකිස්තානයේ, ජපානයේ, ප්‍රංසයේ, බටහිර ජර්මනියේ, චීන මහජන සමූහාණ්ඩුවේ, එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ, කැනඩාවේ, නෙදර්ලන්තයේ, බෙල්ජියමේ, හංගේරියාවේ, බල්ගේරියාවේ, නැගෙනහිර ජර්මනියේ, එක්සත් අරාබි සමූහාණ්ඩුවේ, බුරුමයේ, අයර්ලන්තයේ, ඉරාකයේ, ඉරානයේ, මාලදිවයිනේ, උතුරු කොරියාවේ හා ස්පාඤ්ඤයේ සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයින් ගෙන් ද, ඉන්දියාවේ (බොම්බායේ) හා ඕස්ට්‍රේලියාවේ (සිඩ්නිහි) ලංකා වෙළඳ කොමසාරිස්වරුන්ගෙන් ද හා ඉන්දියාවේ නවදිල්ලියේ සිටින ලංකාවේ පදිංචියට බලය ලත් ලංකාවේ සිටින පිටරට ආණ්ඩු වල නියෝජිතයින්ගෙන් ද ලබාගත හැකි බව නිෂ්පාදක මූලිකයින්ගේ ඒජන්තවරුන් හා නියෝජිතවරුන් විසින් කෙළින්ම ටෙන්ඩර් ඉදිරි පත් කිරීමට බලාපොරොත්තු වන ඔවුන්ගේ පිටරට නිෂ්පාදක මූලික වරුන් වෙත දන්වා සිටිය යුතුය.

10. පළමුවෙනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී හා වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරද්දී සියළුම ටෙන්ඩර්කරුවන්ට එද සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් ද ගාස්තු ප්‍රමාණයන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට ඇසෙන සේ කියවනු ඇත. ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අදහස් කරන ටෙන්ඩර්කරුවකුට, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමග පිළියෙල කර ගැනීමෙන්, ඉදිරිපත් කර ඇති කිසියම් ටෙන්ඩර් පත්‍රයක අනු පිටපත පරීක්ෂා කිරීමට අවසර දෙනු ඇත.

එස්. ඥානසේකරම්,
සෞ. සේ. අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1964.3.16.

3–801—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රජයේ බෙහෙත් ගබඩාව

### ඖෂධ සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

මෙයට යා කොට ඇති උපලේඛනයෙහි සඳහන් ඖෂධයන් දැනට ඇති තොගවලින් සැපයීම සඳහා සීල් තබන ලද මිල ගණන් ප්‍රාදේශීය ඖෂධ නිෂ්පාදකයන්ගෙන් හෝ බලය ලත් ප්‍රාදේශීය ඖෂධ සපයන්නන්ගෙන් හෝ රජයේ බෙහෙත් ගබඩාධිකාරි විසින් බාර ගනු ලැබේ.

2. මිල ගණන් එවීම සඳහා ආකෘති පත්‍ර දෙපාර්තමේන්තුව විසින් සපයනු නොලැබේ. ටෙන්ඩර්කරුවන්ට උපලේඛනයේ සඳහන් එක් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය කිහිපයක් සඳහා හෝ මිල ගණන් එවීම පිණිස ස්වීය ආකෘති පත්‍ර පාවිච්චි කළ හැක.

3. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 64.4.1 සිට ඉදිරියට මාස 6 ක් වලංගුව පැවතිය යුතුයි. ඖෂධ, රජයේ බෙහෙත් ගබඩාවට හෝ මෙහි පහත උපලේඛනයෙහි සඳහන් වෛද්‍ය ආයතනයන්ට හෝ ගෙනැවිත් බාර දිය යුතුයි.

4. සියළුම මිල ගණන්, කොළඹ, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත එවිය යුතුයි. සීල් තැබූ මිල ගණන් බහාලූ කවරයේ වම් පස උඩ කෙළවරේ '' ඖෂධ සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම '' යනුවෙන් සඳහන් කළ යුතු අතර, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

5. සීල් තැබූ මිල ගණන් ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එසේ නැතහොත්, රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරිගේ කාර්යාල කාමර යෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

6. 1964 අප්‍රේල් මස 4 වන දින පෙ.ව. 10 වන තෙක් මිල ගණන් බාර ගනු ලැබේ.

7. පිළිගත් මිළ ගණන් අනුව රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් හෝ උපලේඛනයේ සඳහන් වෛද්‍ය ආයතන බාර නිලධාරින් විසින් හෝ අවශ්‍ය ඖෂධ සඳහා ඇනවුම් ඉදිරිපත් කරනු ලැබේ. ඇනවුම් ඉදිරිපත් කිරීමෙන් දින තුනක් ඇතුළතදී රජයේ බෙහෙත් ගබඩාධිකාරි විසින් හෝ අදාල වෛද්‍ය ආයතන බාර නිලධාරින් විසින් හෝ නම් කරන වේලාවට සහ පිළිවෙලට ද්‍රව්‍ය ගෙනැවිත් බාර දිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ නම්, මිළ ගණන් හා ද්‍රව්‍යයන් යථා කාලයේදී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

9. කිසිම හේතුවක් නොදක්වා යම් මිල ගණනක් හෝ මිල ගණන් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලයත්, මිල ගණන් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළි ගැනීමේ බලයත් රජයේ බෙහෙත් ගබඩාධිකාරි වෙත පැවැරී ඇත. පිළිගත් ටැන්ඩර්කරුවන් වෙත ඇනවුම් ඉදිරිපත් නො කිරීමටත් බලය ඔහු සතුය.

දෙ. ආ. ඇ. මුනසිංහ,
රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි.

1964 මාර්තු මස 10 වනද,
කොළඹ 10,
ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන,
රජයේ බෙහෙත් ගබඩාවේ කාර්යාලයේ දිය.

### ''අ'' උපලේඛනය—ඖෂධ—I වන කොටස

| | (1) ද්‍රව්‍ය විස්තරය | (2) ඒකක | (3) මිල | (4) ඉදිරිපත් කැරෙන ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | ඇමෝනියම් බයිකාබනේට් බී.පී. ... | | | |
| 2. | ඇස්පිරින් බී. පී. පවුඩර් ... | | | |
| 3. | ඩෙක්ස්ට්‍රෝස් 5% බෝතල ... | | | |
| 4. | එමටීන් හයිඩ්‍රොක්ලොරයිඩ් ඇම්පියුල | | | |
| 5. | අ(ර්) ගොමෙට්‍රීන් මි. ග්‍රෑ. 5 ඇම්පියුල | | | |
| 6. | ග්ලිසරීන් 99.5% ... ... | | | |
| 7. | හාෆ් ක්‍රීම් පවුඩර්ඩ් මිල්ක් ... | | | |
| 8. | ඉන්සුලින් ලෙන්ටෙ යුනිට් 40 ... | | | |
| 9. | ඉන්සුලින් ලෙන්ටෙ යුනිට් 80 ... | | | |
| 10. | ඉන්සුලින් ප්ලේන් යුනිට් 40 ... | | | |
| 11. | ඉන්සුලින් ප්ලේන් යුනිට් 80 ... | | | |
| 12. | අයන් ඩෙක්ස්ට්‍රෑන් කොම්ප්ලෙක්ස් ඝන සැ. මී. 5 කුප්පි ... ... | | | |
| 13. | මල්ටිවිටමින් පෙති ... ... | | | |
| 14. | නෝමල් සේලයින් ... ... | | | |
| 15. | තලයිසල්ෆිතයසෝල් බී. පී. 0.5 ග්‍රෑ. ... | | | |
| 16. | ප්‍රොකේන් ඇන්ඩ් ඇඩ්රිනලීන් ඝ. සැ.මී. 2 ඇම්පියුල | | | |
| 17. | ප්‍රොමෙතසීන් හයිඩ්‍රො. 0.25 මි. ග්‍රෑ. ... | | | |
| 18. | සෝඩියම් බයිකාබනේට් බී. පී. ... | | | |
| 19. | සෝඩියම් සැලිසිලේට් ... | | | |
| 20. | සල්ෆඩයසීන් බී. පී. පෙති ... | | | |
| 21. | ටොල්බියුටොමයිඩ් පෙති ... | | | |
| 22. | විටමින් බී. කොම්ප්ලෙක්ස් ... | | | |
| 23. | විටමින් සී. පෙති ... ... | | | |

### ''අ'' උපලේඛනය—ඖෂධ—II වන කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඇන්ට්‍රිනිල් පෙති ... ... | | | |
| 2. | බෙටමෙතසෝන් 0.5 මි. ග්‍රෑ. පෙති ... | | | |
| 3. | ක්‍රිටාගැලික් ... ... | | | |
| 4. | නියොමයිසින් ඇන්ඩ් බැසිට්‍රෙසින් පවුඩර් | | | |
| 5. | ඩිස්පෙක් බෝතල් ... ... | | | |
| 6. | නැන්ඩ්‍රුලෝන් මි. ග්‍රෑ. 25 කුප්පි ... | | | |
| 7. | හයිඩ්‍රොකෝටිසෝන් ඉන්ට්‍රා ආටිකියුලර් ඉන්ජෙක්. ... ... | | | |
| 8. | සයික්ලොෆොස්ෆමයිඩ් මි. ග්‍රෑ. 300 කුප්පි ... | | | |

"අ" උපලේඛනය—ඖෂධ—II වන කොටස (සම්බන්ධයි)

| (1) ද්‍රව්‍ය විස්තරය | (2) ඒකක | (3) මිල | (4) ඉදිරිපත් කැරෙන ප්‍රමාණය |
|---|---|---|---|
| 9. හැලොතේන් මි. ග්‍රෑ. 250 බෝතල් ... | | | |
| 19. ග්‍රිසොෆේපාල්වින් පෙති ... | | | |
| 10 හෙපරින් යුනිට් 5000 කුප්පි ... | | | |
| 12 හයිඩ්‍රොකෝටිසෝන් ඔයින්මන්ට් ... | | | |
| 13 හයිඩ්‍රොකෝටිසෝන් හෙමිසසිනේට් සෝඩියම් ඉන්ට්‍රාවීනස් වයල්ස් ... | | | |
| 14· ලිග්නොකේන් විත් එfපිනfප්‍රින් ඇම්පියුල ... ... | | | |
| 15· ගුවනතඩිනා පෙති ... ... | | | |
| 16· ක්ලොරොප්‍රොමසින් පෙති ... | | | |
| 17· මැලතියන් පවුඩර් ... ... | | | |
| 18· මෙපයිරමින් මැලිඒට් 2.5% ස. සැ. මී. 1 | | | |
| 19. මෙට්‍රනිඩසෝල් පෙති ... | | | |
| 20. ඔක්සිපෙනෝනියම් පෙති ... | | | |
| 21. fපිනයිල් බියුටසෝන් පෙති ... | | | |
| 22. ලිග්නොකේන් වයල්ස් ... | | | |
| 23. පොලිමික්සින් බයි සල්fේඒට් ඉන්ජෙක් | | | |
| 24. පිම්ඩෝන් පෙති ... ... | | | |
| 25. නිඔස්ටිග්මින් පෙති ... | | | |
| 26. පිරිඩොක්සින් මි. ග්‍රෑ. 50 පෙති ... | | | |
| 27. ස්ටෙලසීන් මි. ග්‍රෑ. 5 පෙති ... | | | |
| 28. ඔක්සිටෝසිනි (සින්තටික්) ඇම්පියුල ... | | | |
| 29. ටොfප්‍රනිල් පෙති ... ... | | | |
| 30. වැසොක්සින් ඇම්පියුල ... | | | |

3–533—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

"ආ" උපලේඛනය—අරෝග්‍යශාලා

1. මහා රෝහල, කොළඹ
2. ද සොයිසා කාන්තා රෝහල, කොළඹ
3. කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ
4. නයනාරෝග්‍යශාලාව, කොළඹ
5. රිජ්වේ ආර්යා ළමා රෝහල, කොළඹ
6. මානසික රෝහල, අංගොඩ
7. දන්තායතනය, කොළඹ
8. පිළිකායතනය, මහරගම
9. දකුණ කොළඹ මහා රෝහල, කළුබෝවිල
10. රජයේ රෝහල, බදුල්ල
11. රජයේ රෝහල, ගාල්ල
12. රජයේ රෝහල, යාපනය
13. රජයේ රෝහල, කළුතර
14. රජයේ රෝහල, කෑගල්ල
15. රජයේ රෝහල, මාතලේ
16. රජයේ රෝහල, මාතර
17. රජයේ රෝහල, රාගම
18. රජයේ රෝහල, රත්නපුර
19. රජයේ රෝහල, මහනුවර
20. රජයේ රෝහල, නුවරඑළිය
21. රජයේ රෝහල, හලාවත
22. රජයේ රෝහල, කුරුණෑගල
23. රජයේ රෝහල, අනුරාධපුරය
24. ළය රෝහල, වැලිසර
25. උණ රෝහල, අංගොඩ

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 අප්‍රියෙල් මස 3 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මඩකළපුව අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාසලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| (1) මඩ/පුතුකුඩියිරිප්පු ර. දෙ. මි. විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක්, ගබඩා කාමරයක් සහ කාර්යාල කාමරයක්. |
| (2) මඩ/කළුවන්චිකුඩි ර. දෙ. මි. විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක්. |
| (3) මඩ/තෙට්ටතීව් ර. දෙ. මි. විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක්. |
| (4) මඩ/පදිරිප්පු මහා විද්‍යාලය. | ගුරු නිවාසයක්. |
| (5) මඩ/ජයන්තිපුර සිංහල විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක්, වැසිකිලියක් සහ ළිඳක්. |
| (6) මඩ/කරවාකර්නි ර. දෙ. මි. විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක්, ගබඩා කාමරයක් සහ කාර්යාල කාමරයක්. |
| (7) මඩ/තිකිලිවඩෙයි ර. දෙ. මි. විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ලක්, ගබඩා කාමරයක් සහ කාර්යාල කාමරයක්. |

සංලක්ෂ්‍යය : 1. මඩ—මඩකලපු දිස්ත්‍රික්කය.

**2. අවශ්‍ය ලියාපදිංචි කිරීම—**

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ :—

අංක 1 සිට 4 දක්වා — රුපියල් 15,000.00

අංක 5 සිට 7 දක්වා — රුපියල් 10,000.00

2. ඉහත සඳහන් දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති අයට, විවිධ සේවා සමූපකාර සමිති වලට, කම්කරු සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රියෙල් මස 2 වැනි දා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ, කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ එච්. ඒ. ශාඛාවේ මඩකලපු අධ්‍යාපන කාර්යාලයයේ හෝ කොළඹින් පිට ඕනෑම දිශාපති කාර්යාලයක එම වැඩය සඳහා රු. 100.00 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ අයට පමණි. චෙක් පත්, මුදල් ඇනවුම් හෝ පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර මඩකලපුව, නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. ඉහත සඳහන් 2 වැනි ඡේදයේ සඳහන් වන පරිදි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු, නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලා ගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, මඩකලපුව, යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාර දුන් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද සඳහන් කළ යුතුය.

5. 1964 අප්‍රියෙල් මස 3 වැනි දින පස්වරු 2.30 ට, මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට ඒවා විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු (රේට් ගණන්) ප්‍රමාණයද ටෙන්ඩර්කරුවන්ගේ නම්ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නො අඩු කාලයක් තුල ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද එහිදී පරීක්ෂා කර බැලිය හැකිය.

8. තෝරා ගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදවිය යුත්තේ පුහුණු හෝ වේවා, නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම

කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් සහ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද යටත් වේ. ලාංකීක නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය නොලබා ගෙන සේවයේ යෙදීම තහනම්ය.

වී. ජී. බී. මුණසිංහ,
නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 මාර්තු 13 වැනි දින,
මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේදීය.

3–742/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 අප්‍රියෙල් මස 3 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේවීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාසලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| (1) මඩ/පෙරියකල්ලාර් ර. දෙ. මි. විද්‍යාලය. | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම. |

සංලක්ෂ්‍ය : 1. මඩ=මඩකලපු දිස්ත්‍රික්කය.

2. **අවශ්‍ය ලියාපදිංචි කිරීම—**
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ :—
රුපියල් 20,000.00 යි.

2. ඉහත සඳහන් දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති අයට, විවිධ සේවා සමූපකාර සමිති වලට, කම්කරු සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රියෙල් මස 2 වැනි දා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ එච්. ඒ. ශාඛාවේ, මඩකලපු අධ්‍යාපන කාර්යාලයයේ හෝ කොළඹින් පිට ඕනෑම දිශාපති කාර්යාලයක එම වැඩය සඳහා රු. 100.00 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ අයට පමණි. චෙක් පත්, මුදල් ඇනවුම් හෝ පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර මඩකලපුව, නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. ඉහත සඳහන් 2 වැනි ඡේදයේ සඳහන් වන පරිදි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු, නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලා ගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාර දුන් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනය ද, වැඩෙහි නමද සඳහන් කළ යුතුය.

5. 1964 අප්‍රියෙල් මස 3 වැනි දින පස්වරු 2.30 ට, කොළඹ මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර් කරුවන්ට ඒවා විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු (රේට් ගණන්) ප්‍රමාණයද ටෙන්ඩර් කරුවන්ගේ නම්ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුල ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් ලිය කියවිලිද එහිදී පරීක්ෂා කර බැලිය හැකිය.

8. තෝර ගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදවිය යුත්තේ පුහුණු හෝ වේවා, නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් සහ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද යටත් වේ. ලාංකීක නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය නොලබා ගෙන සේවයේ යෙදීම තහනම්ය.

වී. ජී. බී. මුණසිංහ,
නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 මාර්තු 13 වැනි දින,
මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේදීය.

3–742/3—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964ක් වූ අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| (1) කු/කොස්ගොල්ල විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (2) කු/අනුගොඩ විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (3) කු/බෝගොඩ විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (4) කු/හාපත්ගමුව විද්‍යාලය | ... | විශාල අළුත්වැඩියාව |
| (5) කු/නැලව විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (6) කු/බරාගෙදර මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (7) කු/නාගොල්ලාගොඩ මහා විද්‍යාලය | | පාසැල් ගොඩනැගිල්ල |
| (8) කු/හොරොම්බාව විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (9) කු/තෙලහැර විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (10) කු/තල්ගහපොත්ත විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| (11) කු/කිරිමැටියාව මහා විද්‍යාලය | ... | වහළ අළුත්වැඩියාව |

සංලක්ෂ්‍යය.—කු = කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. **අවශ්‍ය ලියාපදිංචි කිරීම.**—අංක 1 සිට 7 දක්වා රුපියල් 15,000 හෝ ඊට වැඩි ගණනකට.

අංක 8 සිට 10 දක්වා රුපියල් 10,000 හෝ ඊට වැඩි ගණනකට.

අංක 11 සඳහා පමණක් රුපියල් 5,000 හෝ ඊට වැඩි ගණනකට.

ඉහත දක්වෙන සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමූපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිති වලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් ද තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සි, කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කිරීමෙන් පසුවය. චෙක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ. අනුමත සමිති සඳහා ටෙන්ඩර් පත් නිකුත් කිරීමට තැන්පත් මුදල් අය කරනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. ඉහත සඳහන් දෙවන ඡේදයේ දක්වෙන පරිදි කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. සැලැස්මද එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, "කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත" ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. වර්ෂ 1964 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පස්වරු 2.30 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලි ද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක...

8. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියලුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙයෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑමවිටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක,
වයඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964ක් වූ මාර්තු මස 12 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ය.

3-516/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964ක් වූ අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| | පාසැලේ නම | කළයුතු වැඩ |
|---|---|---|
| (1) | කු/මහමීතව විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල |
| (2) | කු/නිකවැරටිය ජයන්ති විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල |
| (3) | කු/බරහැලගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල |
| (4) | කු/ඉඳුල්ගොඩකන්ද මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල |

**සංලක්ෂ්‍යය.**—කු = කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. **අවශ්‍ය ලියාපදිංචි කිරීම.**—අංක 1 සිට 4 දක්වා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට.

ඉහත දක්වෙන සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිති වලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට මිනුම දිසාපති කාර්යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් ද තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සි, කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කිරීමෙන් පසුවය. චෙක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ. අනුමත සමිති සඳහා ටෙන්ඩර් පත් නිකුත් කිරීමට තැන්පත් මුදල් අය කරනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. ඉහත සඳහන් දෙවන ඡේදයේ දක්වෙන පරිදි කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. සැලැස්මද එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, "කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත" ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිත යන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. එසේ භාර දෙන ලද ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නාම හා ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. වර්ෂ 1964 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලි ද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියලුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙයෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑමවිටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක,
වයඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964ක් වූ මාර්තු මස 12 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ය.

3-516/2—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

7. වෙනත් අවශ්‍ය විස්තර තංගල්ලේ අධ්‍යාපන නිළධාරී තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය, ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසරදී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර, අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිලිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාසේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත්වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

සී. ඒ. ජී. ප්‍රනාන්දු,
තංගල්ලේ අධ්‍යාපන නිළධාරී.

1964.3.12 වැනි දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදීය.

3–692—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 අප්‍රේල් මස 10 වැනි සිකුරාද පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| (1) මා/විජය විදුහල | ... ... | වැඩිදියුණු කිරීම |
| (2) මා/නිලගම විද්‍යාලය | ... .... | ගුරු නිවාස |
| (3) මා/රුසිගම විද්‍යාලය | ... ... | එම |
| (4) මා/රත්මල්ගහඇල විද්‍යාලය | ... | එම |
| (5) මා/බෙලිගමුව විද්‍යාලය | ... | ගොඩනැගිල්ල |
| (6) මා/නීරන්ගමුව විද්‍යාලය | ... | එම |

අංක (1) සංලක්ෂ්‍යය : මා = මාතලේ දිස්ත්‍රික්කය.

අංක (2) අවශ්‍ය ලියාපදිංචි කිරීම:—

| | | අධ්‍යාපන දෙපාර්කමේන්තුව හා ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුව | | අනුමතකළ සමිති සමාගම් |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| අංක 1 | ... | 5,000 | ... | 5,000 |
| අංක 2 සිට 6 | ... | 15,000 | ... | 15,000 |

2. ඉහත දක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ ඊට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අනුමත කරන ලද විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමූපකාර සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 9 වැනිද දවල් 12 වනතුරු නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක අංක 1 සිට 6 දක්වා වැඩ සඳහා රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් මාතලේ අධ්‍යාපන නිලධාරිතුමන් වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍රය කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතලේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් හෝ ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. පූර්වෝක්ත දෙවැනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි කුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියළුම විස්තර සහ තොරතුරු මාතලේ අධ්‍යාපන නිලධාරි තුමන්ගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය මාතලේ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී එසේ භාරගත් බවට එකෙණෙහි ම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නම ද ලියා තිබිය යුතුය.

6. 1964 අප්‍රේල් මස 10 වැනි දින පෙරවරු 10.30ට මාතලේ අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරිතැන විසින් ගාස්තු ප්‍රමාණය ද, ටෙන්ඩර්කරුවන්ගේ නම් ද, පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර මාතලේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂා කර බැලිය හැක.

9. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා, නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන් ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ ම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර, අන් සෑම විට ම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළා සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

පී. එම්. වෙලගෙදර,
මාතලේ අධ්‍යාපන නිලධාරී.

1964 මාර්තු 12 වැනි දින,
මාතලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

3–715/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 අප්‍රේල් මස 10 වැනි සිකුරාද පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| (1) මා/ඇහැලේපොල විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ල |
| (2) මා/වහකෝට්ටෙ රෝ. ක. විද්‍යාලය | ... | එම |
| (3) මා/යටිගල්පොත්ත විද්‍යාලය | ... | එම |
| (4) මා/බුලනවැව විද්‍යාලය | ... | ගොඩනැගිලි ආදිය |

අංක (1) සංලක්ෂ්‍යය.—මා = මාතලේ දිස්ත්‍රික්කය

අංක (2) අවශ්‍ය ලියාපදිංචි කිරීම :—

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | අනුමත කළ සමිති සමාගම් |
|---|---|---|---|
| | රුපියල් | | රුපියල් |
| අංක 1 සිට 3 | 20,000 | ... | 20,000 |
| අංක 4 ... | 25,000 | ... | 25,000 |

2. ඉහත දක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්කමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ අයට සහ ඊට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අනුමත කරන ලද විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමූපකාර සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 9 වැනිද දවල් 12 වනතුරු නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක අංක 1 සිට 4 වැඩ සඳහා රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් මාතලේ අධ්‍යාපන නිලධාරිතුමන් වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍රය කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතලේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ

ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡෙදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිවී ඇතිබවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. පූර්වෝක්ත දෙවැනි ඡෙදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමඟය. සියළුම විස්තර සහ තොරතුරු මාතලේ අධ්‍යාපන නිලධාරිතුමා ගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිත යන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය කොළඹ අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙණෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය.

6. 1964 අප්‍රේල් මස 10 වැනි දින පස්වරු 2.30ට කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර මාතලේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

9. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා, නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩර යට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂක වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර, අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාසේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

පී. එම්. වෙලගෙදර,
මාතලේ අධ්‍යාපන නිලධාරි.

1964 මාර්තු 12 වැනි දින,
මාතලේ අධ්‍යාපන කාර්යාලයේදීය.

3–715/2—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 අප්‍රියෙල් මස 10 වැනි කිව් දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාසැලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|---|
| (1) | ගා/තල්ගස්ගොඩ විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (2) | ගා/තුන්දූව විද්‍යාලය ... | ... | අළුත්වැඩියාව |
| (3) | ගා/සිද්ධාර්ථ ප්‍රාථමික පාසැල | ... | අළුත්වැඩියාව |
| (4) | ගා/පැලැගස්පලාත විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (5) | ගා/වැලිතර ළදරු පාසැල | ... | අළුත්වැඩියාව |
| (6) | ගා/නියාගම ලංකා සභා පාසැල | ... | අළුත්වැඩියාව |
| (7) | ගා/ගල්බොඩ විද්‍යාලය ... | ... | අළුත්වැඩියාව |
| (8) | ගා/වඳුරඹ මධ්‍ය මහා විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (9) | ගා/උලුවිටිකේ ප්‍රාථමික පාසැල | ... | පඩිපෙල සහ පැතිබැම්ම අළුත්වැඩියාව |
| (10) | ගා/බද්දේගම ශාන්ත අන්තෝනි විද්‍යාලය | | අළුත්වැඩියාව |
| (11) | ගා/බොනවිස්ටා ප්‍රාථමික පාසැල | ... | අළුත්වැඩියාව |
| (12) | ගා/අහංගම ධර්මාරාම විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (13) | ගා/හප්පිටිය විද්‍යාලය ... | ... | පාසැල් ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම |
| (14) | ගා/කිඹීය පිරිමි පාසැල ... | ... | ක්‍රීඩාභූමිය |
| (15) | ගා/බෙන්තොට ගාමිණී විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (16) | ගා/නාඹරවත්ත විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (17) | ගා/කහදූව මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම |
| (18) | ගා/තිත්තගල්ල අටානිකිත විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (19) | ගා/කුලීගොඩ විද්‍යාලය | ... | පැතිබැම්ම |
| (20) | ගා/ගිංතොට ගෞතම විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (21) | ගා/පටුවත සීලක්කන්ද විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (22) | ගා/දික්කුඹුර සිද්ධාර්ථ විද්‍යාලය | ... | ගුරු නිවාසය අළුත් වැඩියාව |
| (23) | ගා/කතලුව මහා විද්‍යාලය | ... | ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම |
| (24) | ගා/තිත්තගල්ල අත්තදස්සී විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (25) | ගා/ගෝනගල ළදරු පාසැල | ... | අළුත්වැඩියාව |
| (26) | ගා/ගනේගොඩ විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (27) | ගා/මාඉටිපේ ශ්‍රී විජයරාජ විද්‍යාලය | ... | අළුත්වැඩියාව |
| (28) | ගා/තොටගොඩ අත්තදස්සී කණිෂ්ඨ පාසැල | | අළුත්වැඩියාව |
| (29) | ගා/කළුආරච්චිගොඩ විද්‍යාලය | ... | ගුරු නිවාස |
| (30) | ගා/ගොඩමුන මහා විද්‍යාලය | ... | ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම |
| (31) | ගා/කුලීගොඩ විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (32) | ගා/හල්පාතොට රෝමානු කතෝලික පාසැල | | අළුත්වැඩියාව |
| (33) | ගා/උඩලවත්ත විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (34) | ගා/දෙල්ලව විද්‍යාලය ... | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (35) | ගා/පොල්පාගොඩ මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (36) | ගා/පිටදෙනිය විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (37) | ගා/පනන්ගල විද්‍යාලය ... | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (38) | ගා/නාගොඩ මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (39) | ගා/ඕපාත මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (40) | ගා/ගිනිමැල්ලගහ ගුණරතන විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| (41) | ගා/උඩුගම මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |

සංලක්ෂ්‍යය : 1. ගා = ගාලු දිස්ත්‍රික්කය

සංලක්ෂ්‍යය : 2. අවශ්‍ය ලියා පදිංචි කිරීම—

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව රුපියල් | ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් | අනුමතකළ සමිති සමාගම් රුපියල් |
|---|---|---|---|
| අංක 1–14 | 5,000 | 5,000 | 5,000 |
| අංක 15–19 | 7,500 | 7,500 | 7,500 |
| අංක 20–24 | 10,000 | 10,000 | 10,000 |
| අංක 25–31 | 12,500 | 12,500 | 12,500 |
| අංක 32–41 | 15,000 | 15,000 | 15,000 |

2. ඉහත දැක්වෙන දෙවන සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන් තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ කළ හැකි බවට සමුපකාර රෙජිස්ත්‍රාර් තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ සහතිකයක් ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ඉදිරිපත් කළ හැකි විවිධසේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රියෙල් මස 9 වැනිද දවල් 12.00 වනතෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් 100 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය බාරගනු නොලැබේ.

රුපියල් 15,000ට වැඩි වැඩ සඳහා අනුමත කළ සමිති සමාගම්වලට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඔවුන් කොන්ත්‍රාත්කරුවන් වශයෙන් මේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිනම් පමණකි.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡෙදයේ සඳහන්වන පරිදි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවෙනි පිටපත කුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර '' ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, ගාල්ල යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය, ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 ක්වූ අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) කෑ/උඩුමාගම විද්‍යාලය ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (2) කෑ/ශාන්ත - මරියා මහා විද්‍යාලය ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (3) කෑ/නිවුන්හැල්ල විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (4) කෑ/හකහින්න බාලිකා විද්‍යාලය ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (5) කෑ/ගත්තුන උඩගම විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (6) කෑ/දූවක්දෙනිය විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| (7) කෑ/වලගම මහා විද්‍යාලය | කෘෂිකර්ම විද්‍යාගාර ගොඩනැගිල්ලක් තැනීම |
| (8) කෑ/පින්නවල මහා විද්‍යාලය | කෘෂිකර්ම විද්‍යාගාර ගොඩනැගිල්ලක් තැනීම |
| (9) කෑ/මාවතගොඩ මධ්‍ය මහා විද්‍යාලය ... | ක්‍රීඩා භූමියක් තැනීම |

සංලක්ෂ්‍යය.—කෑ = කෑගල්ල දිස්ත්‍රික්කය.

2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් වශයෙන් පහත දක්වන අයුරු ලියාපදිංචි වී සිටින අයට 1964 අප්‍රේල් මස 8 වැනි බදාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

අංක (1) සිට (4) දරණ වැඩ සඳහා රු. 14,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (5) දරණ වැඩය සඳහා රු. 1,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (6) සිට (8) දරණ වැඩ සඳහා රු. 8,500ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (9) දරණ වැඩය සඳහා රු. 6,000ට හෝ ඊට වැඩි ගණනකටද වේ.

3. අනුමත කරන ලද සුදුසු සමුපකාර සමිති/සංගම්, කම්කරු සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති මෙම වැඩ කොන්ත්‍රාත් භාර ගැනීමට කැමැත්ත පළ කළ කල්හි දෙපාර්තමේන්තු ඇස්තමේන්තු ගණන් අනුව මෙම වැඩ එම සමිතිවලට භාර දෙනු ලැබේ. වැඩ භාර ගැනීමට බලාපොරොත්තු සමිති/සංගම් මෙම වැඩ කිරීමට හැකියාවක් තිබෙන බවට කෑගල්ලේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැනගෙන් (සමුපකාර සමිති නම්) හෝ කෑගල්ලේ දිසාපති තැනගෙන් (ග්‍රාම සංවර්ධන සමිති නම්) සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින්, කොළඹ 2, මලයි වීදියේ පිහිටි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ.සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ, එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 බැගින් මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි කෑගල්ල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. චෙක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වවුචර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ පාසල් ගොඩනැගිලි පිළිබඳ ශාඛාවෙන් හෝ කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් හෝ ලබා ගත හැකිය. මුදල් තැන්පත් කිරීමේ වවුචර නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියා පදිංචිවී ඇති බව ඔප්පු කරන කොන්ත්‍රාත්කරුවන්ට පමණකි.

6. ඉහත සඳහන් දෙවන ඡෙදයේ දැක්වෙන පරිදි කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සැලැස්මවල් සහ සියලුම විස්තර හා තොරතුරු එම කාර්යාලයේදී දැනගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුය.

7. වර්ෂ 1964 අප්‍රේල් 10 වැනි සිකුරාදා පෙරවරු 10 30ට කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම පුහුණු හා නුපුහුණු සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කරවන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කරන ප්‍රදේශයෙහි වූ සේවකයන් පමණක් වැඩයෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්වරයාගෙන් සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාසේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කරන ප්‍රදේශයෙහි නොවූ හෝ ලාංකික සේවකයින් වැඩයෙහි යෙදවීම තහනම්ය.

කේ. අසෝකා ධර්මකීර්ති,
කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 මාර්තු මස 14 වැනි දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

3–743/2—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පෝෂකර්ම සංස්ථාව

ලීබඩු, වානේ ලොකර්, වානේ අල්මාරි සහ වෙනත් කාර්යාලීය උපකරන සැපයීමට සීල් තබන ලද ටෙන්ඩර් 1964 අප්‍රේල් මස 24 වෙනි දින සවස 4.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් ලියකියවිලි සහ වෙනත් විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

මිලදී ගැනීම් හා විකිණීම් පිළිබඳ නිලධාරි.

ජාතික පෝෂකර්ම සංස්ථාව,
32 ඒ, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

3–729—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

### හිස් සිමෙන්ති කොට්ට උර විකිණීමයි

අතුරුගිරියේ පිහිටි ලංකා වානේ සංස්ථාවේ වැඩ පලෙහිදී සතියේ දිනවල පෙ.ව. 9 හා ප.ව. 3.30 අතර කාලය තුළ බලාගත හැකි හිස් සිමෙන්ති කොට්ට උර 2,000ක් පමණ මිළට ගැනීම සඳහා, 64.3.27 වන දින හෝ ඊට පෙර, මුද්‍රා යෙදූ මිළ සැළ පහත සඳහන් අය විසින් භාරගනු ලැබේ. මිළ සැළ කළ යුත්තේ උර 100 ගණනේ ය.

සැපයුම් නිලධාරි.

ලංකා වානේ සංස්ථාව,
අතුරුගිරිය.

3–760—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## අගුල් සැපයීම සඳහා ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් වර්ෂ 1964 වූ අප්‍රේල් මස 3 වෙනි දින දවල් 12 දක්වා බැදී දෙල් ලීයෙන් අගුල් පහක් සෑදීම සහ සැපයීම සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ. අගුල්වල ප්‍රමාණය පහත සඳහන් පරිදි වියයුතුය :—

දිගු අඩි 15½.
වටකුරු ප්‍රමාණය අඩි 4.
ඝනකම අගල් 1½.

2. ටෙන්ඩර් පත්‍රිකාවක් වෙනුවෙන් රු. 10 ක් කොළඹ කච්චේරියේ තැන්පත් කොට, මෙම පෝර්ම 1964 අප්‍රේල් මස 2 වෙනි දින දවල් 12 දක්වා ලබාගත හැක.

3. මේ සඳහා වැඩි විස්තර කොළඹ කච්චේරියේ සමාජ සේවා අංශයෙන් දැනගත හැක.

ඊ. බී. අබේසේකර,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1964 මාර්තු 6 දින,
කොළඹ කච්චේරියේ දීය.

3–560—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

**කොළඹ වරායේ සිට කොළඹ සහ වැලිසර පිහිටි ස.තො.ස. ශාඛාවන්ට බඩු ප්‍රවාහනය කිරීම**

කොළඹ වරායේ සිට කොළඹ සහ වැලිසර පිහිටි ස.තො.ස. ශාඛාවන්ට බඩු ප්‍රවාහනය කිරීම සඳහා සමුපකාර සමිති සංගම්වලින් සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත් සහ අනිකුත් විස්තර 1964.3.25 වෙනි දින දහවල් 12 ට පෙර කොළඹ 10, ස.තො.ස. ප්‍රවාහන අංශයේ කළමනාකාර තැනගේ කාර්යාලයෙන් රු. 250 ගෙවීමෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් පත් භාර ගැනීම 1964.3.25 වෙනි දින අ.භා. 2 ට අවසන් වේ.

සාමාන්‍යාධිකාරි තැන,
සමුපකාර තොග වෙළඳ සංස්ථාව.

1964.3.12 දූ.

3-643/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

**කොළඹ සහ වැලිසර ස.තො.ස. ගබඩාවලින් ස.තො.ස. ශාඛාවන්ට ලොරිවලින් බඩු ප්‍රවාහනය කිරීම**

කොළඹ සහ වැළිසර ගබඩාවලින් පහත සඳහන් ශාඛාවලට බඩු ප්‍රවාහනය කිරීමට සමුපකාර සමිති සංගම්වලින් සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| බලංගොඩ | පොලොන්නරුව | ආනමඩුව |
| හලාවත | මාදම්පෙ | උඩුබද්දව |
| කුලියාපිටිය | රුවන්වැල්ල | කල්මුනේ |
| අම්පාරෙ | | |

ටෙන්ඩර් පත් සහ අනිකුත් කරුණු නො: 85, මැකලම් පාර, කොළඹ 10, ප්‍රවාහන අංශයේ කළමනාකරුගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත් භාර ගැනීම 1964.3.25 වෙනි දින අපරභාග 2ට අවසන් වෙයි.

සාමාන්‍යාධිකාරි තැන.

ස.තො.ස. රථසේවා අංශය,
85, මැකලම් පාර,
කොළඹ 10,
1964.2.2ද.

3-731—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**විදුලි උපකරණ සපයා සවි කිරීමේ ටැන්ඩරය**

1964 පෙබරවාරි 14 වෙනි දින ගැසට් පත්‍රිකාවේ නිවේදනයට අමතරව කරුණාකර පහත සඳහන් දේ සටහන් කරගන්න:—

(1) ටැන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1964 අප්‍රේල් මස 17 වෙනි දින් පස්වරු 3 දක්වා දීර්ඝ කරඇත.

(2) ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1964 මාර්තු මස 28 වෙනි දින දහවල් 12 දක්වා දීර්ඝ කර ඇත.

ඕ. ඩී. ඩබ්. ජේ. ඊ. අබෙයරත්න,
සැපයීම් නිලධාරී.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත.
කොළඹ 2.

3-827—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය.

## ටෙන්ඩර් දැන්වීමයි

**අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය**

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිතුමා විසින් වශී 1964 අප්‍රියෙල් මස 11 වැනි දින පෙරවරු 10 දක්වා පහත පෙන්වා ඇති වැඩ සම්බන්ධව සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

1. අනුරාධපුර නව නගරයේ ඊ. වී. පාර හා ආලංකුලම පාර යන පාරවල් ගල් ඇතිරීම හා තාර දැමීම.
2. අනුරාධපුර නව නගරයේ II වැනි පියවරේ දෙබිඩි නිවාස 25 ක් (නිවාස 50) ක් ගොඩනැගීම.
3. අනුරාධපුර නව නගරයේ II වැනි පියවරේ කිඩ්. ආර්. එස්. පාරේ ගල් ඇතිරීම හා තාර දැමීම.
4. අනුරාධපුර නව නගරයේ II වැනි පියවරේ සිරිමෙවන් ගොඩගේ මාවත පාරට ගල් අතුරා තාර දැමීම.
5. අනුරාධපුර නව නගරයේ I වැනි පියවරේ කාමර තුනේ නිවාස 5 හේ කටු කම්බි ගසා ගේට්ටු දමා වැඩිදියුණු කිරීම.
6. අනුරාධපුර නගරයේ බෝක්කු හා අනික් වැඩ සඳහා කඩාපු කුඩා ගල් සහ සක්ක ගල් සැපයීම.

ටෙන්ඩර්කරුවන් රජයේ දෙපාර්තමේන්තුවල හෝ පළාත් පාලන සේවාවන්හි හෝ රජයේ සංස්ථාවන්හි හෝ මණ්ඩලයන්හි සිවිල් ඉංජිනේරු වැඩ සඳහා ලියා පදිංචිවූවන් විය යුතුයි. අඩු වශයෙන් මේ ටෙන්ඩර් අංක 1 සහ 2 සඳහා රුපියල් 300,000 කද, අංක 3 සඳහා රුපියල් 45,000 කද, අංක 4 සඳහා රුපියල් 25,000 කද, අංක 5 සහ 6 සඳහා රුපියල් 15,000 කද, ලියා පදිංචි වීම පිළිවෙලින් ගණන් ගනු ලැබේ.

යථෝක්ත වැඩ භාරගත් ටෙන්ඩර්කරුවන් විසින් සීමිත කාලයක් ඇතුලත දී නිමකල යුතුව ඇත. පටන් ගැනීමේ කාලය ප්‍රධානය කරන ලද දිනයේ සිට පිළිවෙලින් අංක 1 දරණ වැඩය වෂියක් ඇතුලත දී ද, අංක 2 දරණ වැඩය නව මසක් ඇතුළතදී ද, අංක 3 සහ 4 දරණ වැඩ සිව් මසක් ඇතුළත දී ද, අංක 5 සහ 6 දරණ වැඩය 3 මසක් ඇතුළත දී ද, නිමාවට පත් කල යුතුයි.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබාගත් ආකෘති පත් මගින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් සඳහා කෙරෙන තැන්පත් මුදල් ලියා පදිංචිවීමේ සහතික ඉදිරිපත් කළ විට, 1964 මාර්තු 31 වැනි දින පස්වරු 2 දක්වා භාරගනු ලැබේ. අංක 1 හා 2 යන අංකයන්හි එක් එක් අංක සඳහා කළ යුතු තැන්පත් මුදල රුපියල් 250 වන අතර, අංක 3 සඳහා රුපියල් 50 ක් ද, අංක 4, 5 හා 6 යන අංකයන්හි එක් එක් අංක සඳහා රුපියල් 25 ක් ද වේ.

1964 අප්‍රියෙල් 1 වැනි දින ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කල කුවිතාන්සිය ඉදිරිපත් කල විට යථෝක්ත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේ දී 1964 අප්‍රියෙල් මස 11 වැනි දින පෙරවරු 10.30 ට ටෙන්ඩර් ඉල්ලුම්පත් විවෘත කරනු ලැබේ. ඕනෑම ඉල්ලුම්කරුවෙකුට තමාට අභිමත පරිදි ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ඉදිරිපත් වීමට ඉඩ දෙනු ලැබේ.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ ඉංජිනේරු සහායක තැන කලින් හමුවීමෙන් හෝ දන්වා අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලීය කාර්මික අංශයෙන් මේ සම්බන්ධ ආකෘති හා විස්තර සටහන් විමසීම් ආදිය බලාගැනීමට පුළුවන් වනවා ඇත.

වැඩිපුර වෙනත් විස්තර අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගේ සාමාන්‍ය කාර්යාලවේලාවන් හි දී ලබාගත හැක.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ
සාමාන්‍යාධිකාරී.

1964 මාර්තු මස 10 දින.
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දී ය.

3-590—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් $\frac{3}{4}$ කළුගල් කියුබ් 250ක් සහ අඟල් $\frac{1}{2}$ කළුගල් කියුබ් 100ක් ගුනම්සක තුල්දී කැකිරාවේ දුම්රිය අංගනයට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1964 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්මද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඊ. වෛද්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන, ල. දු. දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1964 මාර්තු 14 වැනි දින.

3-800—64.3.20 න අංක 13,992 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහන කටයුතු පළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් පස් කියුබ් 4,000ක් බත්තුළුඔය දුම්රිය අංගනය සපයා පිරවීම සඳහා ටෙන්ඩර පත්‍ර 1964 අප්‍රේල් මස 15 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාරගනු ලැබේ. එදිනම පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝරම කොළ ලබාගෙන සම්පූර්ණ කොට අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1964 අප්‍රේල් මස 1 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 62,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද තැන්පත් කර ලබාගත් රිසිට්පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාරයාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. අංක 370,
1964 මාර්තු මස 14 දින,
කොළඹදීය.

3–808—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් ¾ කළුගල් කියුබ් 200 සහ අඟල් ¾ කළුගල් කියුබ් 300 තෙමසක් තුළදී ඒරාවූර් දුම්රිය අංගනයට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩරකරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1964 අප්‍රේල් 3 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය. ...

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්මද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන, ලං. දු. දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1964 මාර්තු 14 වැනි දින.

3–809—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් ෆෙයාර්මන් වරුන්ට විශ්‍රාම ශාලාවක් ගල්ඔයදී ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1964 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 48,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන්කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1964 මාර්තු මස 14 දින,
කොළඹදීය.
(තැ. පෙ. 370).

3–807—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් මනම්පිටිය දුම්රිය අංගනයට පස් කියුබ් 3,000ක් සපයා පිරවීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණ කොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1964 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 48,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

(තැ. පෙ. 370),
1964 මාර්තු මස 14 දින,
කොළඹදීය.

3–792—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පැල්මඩුල්ල දිස්ත්‍රික්කයේ සිල්කෝට් සහ ප්‍රෙමික්ස් වැඩවලට අඟල් ½ ගල් කියුබ් 189ක් සහ අඟල් ¾ ගල් කියුබ් 63ක් සැපයීමට සහ ගෙනැවිත් භාරදීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 22 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ. 1964 අප්‍රේල් මස 23 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

2. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පැල්මඩුල්ලේ විධායක ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන ; නිදර්ශන :—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටැන්ඩර් පත් නිකුත් කිරීම ලාංකිකයින්ටද ලාංකික වෙළඳ සමාගම් සහ අනිකුත් ලාංකික සමාගම්වලටද සීමාකර තිබේ.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964.3.16.

3–803—64.3.20 දින අංක 13.992 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

නාරාහේන්පිට යෝජිත නව පළතුරු කම්හල තැනීම (තුන්වැනි පියවර) සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 11 වන තේක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 අප්‍රේල් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,80,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඇන්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1964 මාර්තු 16.

3–802/1—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ගලහ නව රෝහලේ මාතෘ වාට්ටුව, මුලුතැන්ගෙය, මිනී කාමරය, ආවරණ මාර්ගය ආදිය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහනුවර ර. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ/විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 අප්‍රේල් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,50,000ට නොඅඩු ගණනකට ලියාපංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1964 මාර්තු 16.

3–802/2—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කෑගල්ලේ නව රෝහලෙහි කසල කාණු ක්‍රමය හා අභ්‍යන්තරික ජලය බෙදා හැරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 11 වන් තෙක් භාරගනු ලැබේ.

2. කෑගල්ලේ නව රෝහල් භූමියෙහි ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු (නිර්මාණ) තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 අප්‍රේල් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි/ජලසේවා හා කාණු ක්‍රම වැඩ සඳහා රුපියල් 3,14.000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායර්ාලයේදීය, 1964 මාර්තු 16.

3–802/3—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පත්තලගෙදර විද්‍යාගුරු අභ්‍යාස විද්‍යාලයේ 5ඒ ශ්‍රේණියේ නිවාස 2ක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. වේයන්ගොඩ ර. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ/විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 අප්‍රේල් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලිය කියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඩබ්ලිව්. ඇන්. ජී. මොට්සන්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1964 මාර්තු 16.

3–802/4—64.3.20 දින අංක 13;992 දරන ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

මගේ අංකය : ඇෆ්. ටී. ඒ. 23/63

### සෞඛ්‍ය දෙපාර්කමේන්තුව—ටෙන්ඩර් ප්‍රතිඵල

**මෙපිරමියින් මැලියේට් බී. ජී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්**

ටෙන්ඩර් පත් අවසාන දිනය : 1963.11.12—අංක 13,722 හා 63.8.9 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය අනුවයි

| විෂය අංකය | විස්තර | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිල |
|---|---|---|---|
| 1 ... | මෙපිරමියන් මැලියේට් බී. ජී. මි ග්‍රෑ. 50 පෙති 7,00,000 | මේ ඇන්ඩ් බෙකර් සමාගම, කොළඹ ... | ගෙනැවිත් බාර දීමට පෙති 1,000ක් රු. 7.11යි. |
| 2 ... | එපිඩ්රින් හයිඩ්රොක්ලොරයිඩ් බී. ජී. මි. ග්‍රෑ. 15 ($\frac{1}{4}$ග්‍රු) පෙති 20,00,000 | සීමාසහිත පෙරොසන්ස් රසායනාගාරය, පාකිස්තානය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පෙති 500ක් ප. 0, සි. 1, පැ. 3. |
| 3 ... | සල්පඩයිසින් බී. ජී. ග්‍රෑම 0·5 පෙති 1,00,00,000 | ලැබෝර්ටරීස් ඇවරාල් සමාගම, ඇස්. ඒ. ආර්. ඇල්., පෘතුගාලය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පෙති 1,000 ක් ප. 1, සි. 1, පැ $1\frac{1}{3}$. |
| 4 ... | පෙතායිල් සල්පතයිසෝල් බී. ජී. ග්‍රෑම 0·5 පෙති 1,00,00,000 | වී/ඕ මෙඩෙක්ස්පෝට් සමාගම, සෝවියට් රුසියාව | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පෙති 1,000 ක් ප. 0, සි 7, පැ. 10 යි. |
| 5 ... | සල්පඩමිඩින් බී. ජී. පෙති ග්‍රෑ. 0·5 පෙති 90,00,000 | ලැබෝටරීස් ඇවරාල් සමාගම, ඇස්.ඒ. ආර්. ඇල්., පෘතුගාලය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පෙති 1,000 ප. 0, සි. 10, පැ. $9\frac{1}{2}$. |
| 6 ... | පෙනෝබාබටොන් බී. ජී. පෙති ග්‍රෑ. $\frac{1}{2}$ (මි. ග්‍රෑ.30) පෙති 60,00,000 | ලැබෝටරීස් ඇවරාල් සමාගම, ඇස්. ඒ. ආර්. ඇල්., පෘතුගාලය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව ඇතුලුව පෙති 1,000 ප. 0. සි. 1, පැ. 7. |
| 7 ... | ප්‍රිමිඩොන් බී. ජී. මි. ග්‍රෑ. 250 පෙති 3,00,000 ... | වී/ඕ. මෙඩොක්ස්පොට් සමාගම, සෝවියට් රුසියාව | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පෙති 1,000 ප. 2, සි. 18, පැ. 0. |
| 8 ... | එප්‍රිඩින් (කොම්පවුන්ඩ් කෝටඩ්) 30,00,000 ... | ජේම්ස් පින්ලේ සහ සමාගම, කොළඹ ... | මිල සහ ගෙනැවිත් බාරදීමේ ගාස්තුව සමග පෙති 1,000 රු. 10.81 කි. |

පෙත්තක අන්තර්ගත ද :—
එප්‍රිඩින් හයිඩ්‍රොක්ලොරයිඩ් මි. ග්‍රෑ. 20 ($1\frac{1}{3}$ග්‍රෑ.).
ඇම්ලෝබාබිටොන් බී. ජී. මි. ග්‍රෑ. 30 (ග්‍රෑ. $\frac{1}{2}$)
ඇම්නෝපිලින් බී. ජී. මි ග්‍රෑ. 130 (ග්‍රෑ. 2)

ආලෝකයෙන් ආරක්ෂා වන පරිදි වැකුම් සීල් තබන ලද බෝතල් වල ගබඩා කර තැබීම සුදුසු පරිදි හා නිවර්තන කලාපීය දේශගුණයේ ප්‍රයෝජන ගත හැකි පරිදි අසුරා ඇති පෙති.

ලැබී තිබුන ටෙන්ඩර් පත් සංඛ්‍යාව 79කි.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 584, කොළඹ 1,
1964 මාර්තු 14.

3–789—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇෆ්.ටී.බී. 24/63
ඇන.ලැ. අංක : සී/සී.ඇම්.ඇස්. 1638/62–63

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ටෙන්ඩර් ප්‍රතිපල**

| විෂය | තෝරාගත් ටෙන්ඩර්කරු | මිළ |
|---|---|---|
| හයිඩ්‍රොකෝර්ටිසොන් හෙමිසයිනේට් සෝඩියම් ඉන්ජැක්සන් වයල්ස් 9,000යි (රබර් මැඩිගසන ලද) වයල් එකක හයිඩ්‍රෝ-කෝර්ටිසෝන් මිලි ග්‍රෑ. 100 ප්‍රමාණයක් අඩංගුය. නහරගත කිරීම සඳහා අවශ්‍යය | ඇස්. අප්පුකුට්ටි සහ සමාගම, කොළඹ | ආනයන කර, ගෙනැවිත් බාර දීමට වයල්ස් 12ක් රු. 13.25කි. |

ලැබී තිබුන ටෙන්ඩර් පත් සංඛ්‍යාව 8කි.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ, 1964 මාර්තු 16 දින.

3–793—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

අංකය : ඇෆ්. ටී. සී. 21/63.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් ප්‍රතිඵල

එමටින් හයිඩ්‍රොක්ලොරයිඩ් ඉන්ජෙක්ෂන් බී. පී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්—ටෙන්ඩර් අවසාන දිනය 1963.11.12 අංක 13,722 හා 1963.8.9 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය අනුවයි.

| විෂය | විස්තරය | තෝරාගත් ටෙන්ඩර් කරුගේ නම | පිළිගත් මිල ගණන |
|---|---|---|---|
| 1 ... | එමටින් හයිඩ්‍රොක්ලොරයිඩ් ඉන්ජෙක්ෂන් බී.පී. ග්‍රෙන් ½ (මිග්‍රෑ. 30) සී. සී. 1 ප්‍රමාණය—කුප්පි 1,00,000 | පැටා පාමසි, කොළඹ ... | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සමග කුප්පි 100ක් රු. 19.12 යි. |
| 2 ... | ක්ලොර්ප්‍රොමාසීන් හයිඩ්‍රොක්ලොරයිඩ් ඉන්ජෙක්සන් බී. පී. සීසී. 2 කුප්පි 60,000, 2·5% ඩබ්'වී සොලිව්ෂන් 50 මි. ග්‍රෑ. | ලැබොර්ටරිස් ඇටරාල් සමාගම, පාතුගාලය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සමග කුප්පි 100ක් ප. 0 සී. 7, පැ. 10යි. |
| 3 ... | මෙතොක්සමයිඩ් හයිඩ්‍රොක්ලොරයිඩ් ඉන්ජෙක්සන් බී. ජී. සී. 1959 මිලි ග්‍රෑ. 20 කුප්පි 6000 × 1සීසී කුප්පි. නහර ගත කිරීම සහ මසට විදීමට සුදුසු අනුව ලේබල් කරන ලද | සීමාසහිත ජේ. ඇල්. මොරිසන්ස් පුත්‍ර සහ ජෝන් (ලංකා) සමාගම, කොළඹ | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සමග කුප්පි 25 ක් ප. 0. සී. 11, පැ. 10 කි. |
| 4 ... | විටැමින් බී. 12 ඉන්ජෙක්සන් බී. ජී.. (සයිනා කොබලාමින්) කුප්පි 250,000 සීසී 1ක ඔයි ක්‍රොගෑම් 50 ක් අඩංගුය | පන්ජාබේ ඩ්‍රග් හවුස් සමාගම, පාකිස්තානය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව කුප්පි 50 ක් පකිස්. රුපියල් 1.29 කි. |
| 5 ... | නැන්ඩ්‍රොලෝන් (ඔයිලි) ඉන්ජෙක්සන්ස් (නොත්ඩෝ ස්ටෙන්නෝලොන් පීනිල් ප්‍රොපියෝනේට්) කුප්පි 10,000 × 1 සී. සී. 1 ක මිග්‍රෑ 25යි. මසට විදීම සඳහා | සීමාසහිත ඔර්ගනන් ලැබෝර්ටර් සමාගම, එංගලන්තය | රා නියෝජිතයින් ගේ ගාස්තුව ඇතුලුව මිල සහ කොළඹට ගෙන ඊමේ සම්පූර්ණ තොගයම ප. 1,124, සී. 11, පැ. 2. |
| 6 ... | අයන් ඩෙක්ස්ට්‍රාන් කොම්ප්ලැක්ස් ඉන්ජැක්සන් කුප්පි 200,000 × සී. සී. 2යි. සී. සී. එකක් යකඩ වශයෙන් පෙරික් හයිඩ්‍රොක්සයිඩ් මිග්‍රෑ 50 ක් තිබේ. එම පෙරික් හයිඩ්‍රොක්සයිඩ් ඩෙක්ස්ට්‍රාන් සමග කවලම් කරන ලද මසට විදීමට සුදුසු ඉන්ජෙක්සන් | සීමාසහිත හවුස්මන් ලැබෝර්ටරිස් සමාගම, ස්විට්සර්ලන්තය<br>සීමාසහිත මැක්වුඩ්ස් සමාගම, කොළඹ... | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සහිතව කුප්පි 100 ක් රු. 33.00 ක් වේ.<br>මිල සහ කොළඹට ගෙන ඊමේ, ගාස්තුව කුප්පි 100 ක් ප. 0. සී. 2, පැ. 0 වේ. |
| 7 ... | පිපරසයින් සිට්‍රෙට් ඉලිසීර් (බී. ජී. සී. 1959) ඉලිසීර් ඇම්. ඇල්. 4 ක (විනිමිස් 60) බලය පිපරසයින් හයි ඩේඩ් මිලි ග්‍රෑ. 500 කට සමානය. නියම ගැලුමෙන් ගැලොම් 5,000 | පෙරොසන්ස් ලැබෝර්ටරිස් සමාගම, පකිස්ථානය | මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සමග ගැලොම් භාගයක් ප. 0, සී. 12, පැ. 5¾ කි. |

ලැබී තිබුන ටෙන්ඩර් පත් සංඛ්‍යාව 73 කි

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 584,
කොළඹ, 1964 මාර්තු 14.

ඇෆ්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

3-790—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇෆ්. ටී. බී. 37/63.
ඇන. ලැ. : සී/සී. ඇම්. ඇස්. 1966/63–64.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

| විෂය | විස්තරය | තෝරාගත් ටෙන්ඩර් කරු | මිල |
|---|---|---|---|
| 1 ... | සින්ක් ඔක්සයිඩ් ඇඩ්හෙසිව් ප්ලාස්ටර්ස් බී.පී.සී. ස්පූල්ස් දුසිම 4,000·3" × යාර 5යි | සීමාසහිත දෙරෙයි ඇරුල් සහ සමාගම, කොළඹ | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සහිතව මිල දුසිමක් සිලිං 19යි, පැන් 3කි. |
| 2 ... | සින්ක් ඔක්සයිඩ් සෙල්ප් ඇඩ්හෙසිව් ප්ලාස්ටර්ස් බී. ජී. සී. 1" × යාර 5 දුසිම 1,800 යි | චයිනා නැෂනල් කැමිකල්ස් ඉම්පෝට් සහ ඇක්ස්පෝට් කෝපරේෂන්, ෂැංහයි | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සහිතව දුසිමක් සිලි. 6, පැ. 8 කි. |
| 3 ... | ප්රෝපේලිවින් හෙම්සල්පේට් බී. ජී. ග්‍රෑම්ස් 10,000 හොඳට වසන ලද ග්‍රෑම් 5 හේ වයල්ස් වලින් | අයි. ඩී. අයි. සමාගම, රා/නි. මගින් ... | රා./නි. ගාස්තු ඇතුලුව සම්පූර්ණ මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තු ඇතුලුව පවුම් 293යි. |
| 3(ඒ) ... | එම ... ...<br>ග්‍රෑම් 15,000 හොඳින් වැසූ<br>ග්‍රෑම් 10යේ වයල්ස් වලින් | එම ... | රා./නි. ගාස්තුව සහිතව මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග මිල ප. 300 කි. |
| 3(බී) ... | එම ... ...<br>ග්‍රෑම්ස් 20,000 හොඳින් වැසූ ...<br>ග්‍රෑම්ස් 25 හේ ඩයල්ස් වලින් | එම ... | රා./නි. ගාස්තුව සහිතව මිල සහ කොළඹට ගෙනඊමේ මුළු මිල පවුම 286 කි. |
| 3(සී) ... | එම ... ...<br>ග්‍රෑම්ස් 30,000 හොඳින් වැසූ<br>ග්‍රෑම්ස් 100යේ වයල්ස් වල | එම ... | රා./නි. ගාස්තු සහිතව මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව පවුම 358 කි. |

ලැබී තිබුන ටෙන්ඩර් පත් සංඛ්‍යාව 26කි.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 584, මුදල් අංශය,
කොළඹ ,1964.3.16.

ඇස්. ඥානසේකරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

3-782—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

| වැඩ විස්තර | ලැබුන මුළු ටෙන්ඩර් ගනන | සාර්ථක ටෙන්ඩර් කරුගේ නම | පිලිගත් මුදල |
|---|---|---|---|
| යාපනය උප කොට්ඨාශයේ, කරියාලේ නාගපටුවන් උතුරු මායිමෙ වැසීමේ කපොල්ල | එකයි | සීමාසහිත එන්ජිනියරින්ග් කන්ස්—රක්ෂනස් (ලංකා), කොළඹ | රු. 97,000 |

1964 මාර්තු මස 12 වෙනි දින,
වවුනියාවෙදීය

ආර්. එස්. කර්මානන්දර්
උතුරු කොට්ඨාශයේ
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන

3–691—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාතර්මේන්තුව

### පාවිච්චියට ගත නොහැකි නිල ඇඳුම් බයිසිකල් හා වෙනත් ද්‍රව්‍ය වෙන්දේසිය

වයඹ පළාතේ පොලිස් අධිකාරි තැනගේ බඩු ගබඩාවේදී පාවිච්චියට ගත නොහැකි නිල ඇඳුම්, බයිසිකල් හා වෙනත් ද්‍රව්‍යයන් 1964 මාර්තු මස 28 වැනි සෙනසුරාදා පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් දැනුම් දෙමි. කායසීල වේලාවන් තුලදී මේවා පරීක්ෂාකර බැලිය හැකිය.

වෙන්දේසිය අවසානවූ වහාම මුදල් ගෙවා බඩු ගෙනයා යුතුයි.

සී. එච්. විජේසිංහ,
ව. ප. පොලිස් අධිකාරි වෙනුවට.

පොලිස් කායසීලය,
කුරුණෑගල, 64.3.6.

3–510—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### මී හරකුන් 26 දෙනෙක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මහ ඉලුප්පල්ලම පාසැල් ගොවිපලේ සිටින කෘෂිකාර්මික වැඩට පුහුණු කරණලද දෙමුහුන් මී හරකුන් 26 දෙනෙක් 1964 අප්‍රේල් මස 2 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට එම ගොවිපලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙම හරකුන් සාමාන්‍ය කාර්යාලීය කාලවේලාව ඇතුලතදී මහ ඉලුප්පල්ලම පාසැල් ගොවිපලේදී පරීක්ෂා කළ හැකිය.

3. වෙන්දේසිය අවසන්වූ වහාම ඉල්ලුම් කරණලද මිල ගණන මුදලින් ගෙවා හරකුන් ඉවත් කරගත යුතුයි.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකම් අධ්‍යක්ෂ.

1964 මාර්තු 6 වැනි දින,
පේරාදෙණියේදීය.

3–750—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## හිස් පින් විකිණීම

(1) මරදානේ දුම්රිය ගබඩාවේ ඇති ගැලුම් 45ගේ හිස් පින් 2,000ක් විකිණීම සඳහා ඉල්ලුම් පත් මා විසින් භාරගනු ලැබේ.

(2) හිස් පින් 1ක මිල රු. 20ක් වේ.

(3) ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ නම, ලිපිනය සහ අවශ්‍ය හිස් පින් ප්‍රමාණය දන්වා එවිය යුතුයි. සිල්ලර හෝ තොග වශයෙන් හිස් පින් ඕනෑම ප්‍රමාණයක් මිළයට ගැනීමට ඉල්ලුම් කරුවන්ට ඉඩ දෙනු ලැබේ.

(4) ඉල්ලුම්කරුවන්ට මෙම කාර්යාලයෙන් දැනුම්දුන් විට පින්වල මුළු වටිනාකම දින 3ක් ඇතුළත ගෙවා මුදල් ගෙවූ දින සිට දින 3ක් ඇතුළත එම පින් දුම්රිය ගබඩා භූමියෙන් ඉවත් කර ගත යුතුයි.

(5) මොනම කරුණක් නිසාවත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

ඇම්. සරීන්,
වැ. බ. දුම්රිය ගබඩා අධිකාරී.

1964.3.16 වැනි දින,
කොළඹ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේදී.

3–788—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

කැලෑ දෙපාර්තමේන්තුවට අයත් මොරටුවේ දැව ගබඩාවේ ඇති බුරුත කඳන් 49ක් 1964 අප්‍රේල් මස 7 වෙනි උදේ 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ දැව ලබා ගැනීමට බලාපොරොත්තුවන අයට එම ස්ථානයට ගොස් දැව පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ.

වැඩි විස්තර මොරටුවේ, වේල්ස් කුමාර මාවතේ, රජයේ දැව ගබඩාවේ, ගබඩා පාලකගෙන් දැනගත හැක.

වී. ජෝ. වීරරත්න,
වැඩබලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂකගේ කාර්යාලයය,
තැ. පෙ. 509,
කිව් පාර,
කොළඹ 2,
1964 මාර්තු මස 12 දින.

3–781—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිවාස සඳහා ඉල්ලුම් පත්‍ර, කටුකුරුන්ද නිවාස යෝජනා ක්‍රමය, කළුතර

කළුතර කටුකුරුන්දේ සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි දැනට හිස්ව ඇති අඩු කුලී නිවාස සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති කළුතර දිස්ත්‍රික්කයේ පදිංචි ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 300 කට නොවැඩි අය ;

(ආ) තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් හෝ ගෙයක් නොමැති අය ;

2. සෑම ගෙයක්ම පිහිටා තිබෙන්නේ දළ වශයෙන් පර්චස් 15 ක් පමණ වූ ඉඩමකය. ගෙවල්වල වහළ උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ. බීම පිණිස ජලය ළිංවලින් ලබාගත හැක.

3. ගෙයක කුලිය මසකට රුපියල් 30ක් පමණ වේ. දැනට කර ඇති වැඩි දියුණු කිරීම් නිසා මෙම කුලිය වැඩිවීමට ඉඩ තිබේ.

4. ගෙයි පදිංචි කාරයාට ගෙයි නීත්‍යනුකූල අයිති පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ගෙවන්ට තිබෙන මුදල එකවිටම ගෙවා දැමීමත් සමගම ගෙයි නීත්‍යනුකූල අයිතියත් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙයි නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද වරිපනම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතු වේ.

5. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි.

6. ඉල්ලුම් පත් පිළියෙල කළ යුත්තේ මගේ කාර්යාලයෙන් හෝ කළුතර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකි විශෙෂ ආකෘති පත්වලය.

7. පිළියෙල කරන ලද ඉල්ලුම් පත් ජාතික නිවාස කොමසාරිස් තැන වෙත පහත සඳහන් ලිපිනයට 1964 අප්‍රේල් මස 3 වැනි දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය :—

ජාතික නිවාස කොමසාරිස්,
පාර්සන්ස් පාර,
කොළඹ 2.

8. ඉල්ලුම් පත් එවා දින 14 ක් ඇතුළතදී එය ලැබුණ බවට දැන්වීමක් නොලැබුනහොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් ජාතික නිවාස කොමසාරිස් තැනට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "කටුකුරුන්ද ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ඩී. ටී. ඊ. ඒ. ද පොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස්.

කොළඹ 2.

3–675—64.3.20 දින අංක 13,992 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි